# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරු සිසු අත්වැල

**(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)**

# Economics

නිපුණතාවය 09

විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම ගවේෂණය කරයි.

---

## විදේශ වෙළෙඳාම

**අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා**

**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ**

**සම්පත් දායකත්වය : T T N ශ්‍රීලාල් අභයවංශ**

**ර/රත්මලවින්න ම. වි**

**වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය**

# පාඩමට පිවිසීම

## රටක් තවත් රටක් සමග ගනුදෙනු කිරීමට පෙළඹෙන්නේ ඇයි?

1. ……………………………………………………………………………………
2. ……………………………………………………………………………………
3. ……………………………………………………………………………………
4. ……………………………………………………………………………………
5. ……………………………………………………………………………………
6. ……………………………………………………………………………………
7. ……………………………………………………………………………………
8. ……………………………………………………………………………………
9. ……………………………………………………………………………………
10. ……………………………………………………………………………………
11. ……………………………………………………………………………………
12. ……………………………………………………………………………………
13. ……………………………………………………………………………………
14. ……………………………………………………………………………………

# අපේක්ෂිත ඉගෙනුම් පල

- අන්තර්ජාතික වෙළෙඳාම අර්ථ දක්වයි.
- අන්ත්‍ර්ජාතික වෙළෙඳාමට පදනම් වූ නිරපේක්ෂ වාසි න්‍යායය අර්ථ දක්වයි.
- ඒ ඒ රටට නිරපේක්ෂ වාසි ලැබෙන ආකරය සංඛ්‍යා නිදසුන් මගින් පැහැදිලි කරයි.
- නිරපේක්ෂ වාසි හට ගැනීමට හේතු දක්වයි.
- අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වූ සාපේක්ෂ වාසි න්‍යායය අර්ථ දක්වයි.
- සාපේක්ෂ වාසි න්‍යායය පදනම් වන උපකල්පන දක්වයි.
- සංඛ්‍යා නිදසුන් යොදා ගනිමින් සාපේක්ෂ වාසි ලැබෙන ආකාරය පැහැදිලි කරයි.
- අභ්‍යන්තර හුවමාරු අනුපාතිකය පැහැදිලි කරයි.
- අන්තර්ජාතික වෙළෙඳාමට ප්‍රවේශ වීම සඳහා අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායි බාහිර හුවමාරු අනුපාතය ගණනය කරයි.
- සාපේක්ෂ වාසි හට ගන්නා මූලාශ්‍ර (හේතු) සඳහන් කරයි.
- තරගකාරිත්වයේ වාසිය අන්තර්ජාතික වෙළෙඳාමට බලපාන ආකාරය පැහැදිලි
- කරයි.
- අන්තර්ජාතික වෙළෙඳාමේ දී ඇති වන ස්ථිතික වාසි හා ගතික වාසි පැහැදිලි කරයි

# *විදේශ වෙළඳාම*

**එක් රටක් තවත් රටක් සමග හෝ රටවල් කිහිපයක් සමග භාණ්ඩ හා සේවා හුවමාරු කර ගැනීම *විදේශ වෙළඳාමයි.***

**ආනයන-**

වෙනත් රටකින් මිලදී ගැනීම.

**අපනයන-**

වෙනත් රටකට අලෙවි කිරීම.

**ප්‍රතිඅපනයන-**

යම් රටක් භාණ්ඩ ආනයනය කර එයට **යම්කිසි අගයක් එකතු කර** නැවත අපනයනය කිරීම.

**අන්තරාළ වෙළඳාම**

යම් රටක් භාණ්ඩ ආනයනය කර එයට කිසිදු **අගයක් එකතු කිරීමකින් තොරව** නැවත අපනයනය කිරීම.

## විදේශ වෙළඳාම ව්‍යාප්ත වීමට හේතු

- කිසියම් රටකට තම රටට අවශ්‍ය සියළුම භාණ්ඩ හා සේවා කාර්යක්ෂමව නිපදවීමට නොහැකි වීම.
- .සමහර භාණ්ඩ නිපදවූවත් ස්වයංපෝෂිත නොවීම.
- වඩා හොඳින් නිපදවිය හැකි භාණ්ඩ අත්‍යවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් නිපදවීම.
    - **[සුලභ සම්පත් නිසා භාණ්ඩ නිපදවීම , විශේෂ හැකියාව නිසා** (විශේෂ ප්‍රාගුණ්‍යය) **නිසා භාණ්ඩ නිපදවීම**]

## විදේශ වෙළඳාම ඔස්සේ රටකට ලබාගත හැකි ප්‍රතිලාභ

- ආර්ථික වර්ධනය වේගවත් වී ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීමට හැකිවීම.
- අඩු පිරිවැයකින් ආනයනය කිරීමට හැකිවීම.
- දියුණු තාක්ෂණය හා නව අදහස් රට තුලට ගලා ඒම.
- අපනයනාභිමුඛ නිෂ්පාදන ක්ෂේත්‍රයේ සේවා නියුක්තිය හා ආදායම ඉහළ යාම.
- රාජ්‍ය ආදායම ඉහළ යාම.
- රට තුළ නිපදවිය නොහැකි භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව සැලසීම.
- විදේශ ආයෝජන ආකර්ෂණයට අනුබලයක් සැපයීම.

# විදේශ වෙළඳාම පිළිබඳ න්‍යායන්

වෙළෙඳාමේ පදනම හා එකී පදනමට හේතු වන වෙළඳාමෙන් බිහිවන වාසි එම වාසි නිර්මාණය වන අන්දම රටවල් අතර බෙදී යන ආකාරය හා වෙළෙඳාමේ දිශාව ආදිය තීරණය කරන සාධක පැහැදිලි කිරීම සඳහා අන්තර්ජාතික වෙළෙඳාමට පදනම වන න්‍යායන් දෙකක් භාවිතයේ පවතී.

- නිරපේක්ෂ වාසි න්‍යාය (යෙදවුම් ප්‍රවේශය , නිමැවුම් ප්‍රවේශය)
- සාපේක්ෂ වාසි න්‍යාය (යෙදවුම් ප්‍රවේශය , නිමැවුම් ප්‍රවේශය)

## නිරපේක්ෂ වාසි න්‍යාය [ PRINCIPAL OF ABSOLUTE ADVANTAGE]

[ඇඩම් ස්මිත් (1776)]

කිසියම් රටකට කිසියම් භාණ්ඩයක් වෙනත් රටකට වඩා අඩු පිරිවැයකින් (වැඩි කාර්යක්ෂමතාවකින්) නිෂ්පාදනය කළ හැකි නම් එකී රටට භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ නිරපේක්ෂ වාසියක් පවතින බවත් , එකී රටට කිසියම් භාණ්ඩයක් අඩු පිරිවැයකින් නිෂ්පාදනය කළ නොහැකි නම් (වැඩි පිරිවැය \ අඩු කාර්යක්ෂමතාව) එම රටට එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා නිරපේක්ෂ අවාසි පවතින බවත් **නිරපේක්ෂ වාසි න්‍යායෙන්** පෙනිවා දේ.

නිරපේක්ෂ වාසි න්‍යාය හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි ප්‍රවේශ දෙකකි

- යෙදවුම් ප්‍රවේශය
- නිමැවුම් ප්‍රවේශය

### නිරපේක්ෂ වාසි න්‍යාය පැහැදිලි කිරීමේ යෙදවුම් ප්‍රවේශය

යෙදවුම් ප්‍රවේශය යන්නෙන් අදහස් වන්නේ කිසියම් රටක් තවත් රටකට වඩා අඩු සම්පත් ඒකක ප්‍රමාණයකින් නිපදවිය හැකි භාණ්ඩය අපනයනය කිරීමෙනුත් , වැඩි සම්පත් ඒකක ප්‍රමාණයකින් නිපදවීමට සිදුවන භාණ්ඩය ආනයනය කිරීමෙනුත් දෙරටටම වාසි අත් වන බවයි.

***යෙදවුම් ප්‍රවේශය සඳහා උදාහරණයක් :-***

නිමැවුම් ඒකකයක් සඳහා අවශ්‍ය ශ්‍රම ඒකක ප්‍රමාණය

| භාණ්ඩය | ජපානය | ඉන්දියාව |
|---|---|---|
| **පරිගණක** → | ශ්‍රම ඒකක **8** | ශ්‍රම ඒකක **12** |
| **දුරකථන** → | ශ්‍රම ඒකක **6** | ශ්‍රම ඒකක **4** |

- පරිගණකයක් නිපදවීම සඳහා ජපානයට ශ්‍රම ඒකක 8 ද ඉන්දියාවට ශ්‍රම ඒකක 12 ද අවශ්‍ය වේ.
- දුරකථනයක් නිපදවීම සඳහා ජපානයට ශ්‍රම ඒකක 6 ද ඉන්දියාවට ශ්‍රම ඒකක 4 ද අවශ්‍ය වේ.
  - **මේ අනුව ජපානයට පරිගණක නිපදවීම අඩු පිරිවැයක් (ශ්‍රම ඒකක 8) යටතේ සිදු කිරීමේ හැකියාවක් පවතී.**
  - **එමෙන්ම ඉන්දියාවට දුරකථන නිපදවීම අඩු පිරිවැයක් (ශ්‍රම ඒකක 4) යටතේ සිදු කිරීමේ හැකියාවක් පවතී.**

### අපනයන ආදායම් උපයා වාසි ලබා ගන්නා ආකාරය

මේ අනුව පරිගණකයක් නිපදවීම ජපානය, ඉන්දියාවට සාපේක්ෂව අඩු පිරිවැයක් යටතේ සිදු කිරීමේ හැකියාවක් පවතින බැවින් (පරිගණකයක් නිපදවීම සඳහා ජපානයට ශ්‍රම ඒකක 8 ද ඉන්දියාවට ශ්‍රම ඒකක 12 ක් ද අවශ්‍ය වේ.) **ජපානය පරිගණක නිෂ්පාදනය විශේෂීකරණය කර එහි අතිරික්තය ඉන්දියාවට අපනයනය කිරීමත්** දුරකථනයක් නිපදවීමේදී ඉන්දියාව, ජපානයට සාපේක්ෂව අඩු පිරිවැයක් යටතේ නිපදවීමේ හැකියාවක් පවතින බැවින් (දුරකථන යක් නිපදවීම සඳහා ජපානයට ශ්‍රම ඒකක 6 ද ඉන්දියාවට ශ්‍රම ඒකක 4 ක් ද අවශ්‍ය වේ.) **ඉන්දියාව දුරකථන නිෂ්පාදනය විශේෂීකරණය කර එහි අතිරික්තය ජපානයට අපනයනය කිරීමත්** මගින් දෙරටටම වාසි ලබාගැනීමේ හැකියාවක් පවතී.

### පිරිවැය අඩු භාණ්ඩ ආනයන කර වාසි ලබා ගන්නා ආකාරය

මෙහිදී ජපානයට සාපේක්ෂව වැඩි පිරිවැයක් සහිත භාණ්ඩය වන **දුරකථන ඉන්දියාවෙන් ආනයනය කිරීමෙන්** ද ඉන්දියාවට සාපේක්ෂව වැඩි පිරිවැයක් සහිත භාණ්ඩය වන **පරිගණක ජපානයෙන් ආනයනය කිරීමෙන්** ද දෙරටටම අඩු පිරිවැයක් යටතේ භාණ්ඩ පරිභෝජනය කිරීමේ අවස්ථාව ද හිමිකර ගනී.

## නිරපේක්ෂ වාසි න්‍යාය පැහැදිලි කිරීමේ නිමැවුම් ප්‍රවේශය

නිමැවුම් ප්‍රවේශය යන්නෙන් අදහස් වන්නේ කිසියම් රටක් තවත් රටකට සාපේක්ෂව යෙදවුම් ඒකකයකින් ලබා ගත හැකි නිමැවැම් ඒකක ප්‍රමාණය වැඩිනම් එම භාණ්ඩය අපනයනය කිරීමෙනුත් , යෙදවුම් ඒකකයකින් ලබා ගත හැකි නිපවුම් ඒකක ප්‍රමාණය අඩු නම් එම භාණ්ඩය ආනයනය කිරීමෙනුත් දෙරටටම වාසි අත් වන බවයි.

***නිමැවුම් ප්‍රවේශය සඳහා උදාහරණයක් :-***

ශ්‍රම ඒකකයකින්

නිපදවිය හැකි නිමැවුම් ඒකක ප්‍රමාණය

| භාණ්ඩය | ජපානය | ඉන්දියාව |
|---|---|---|
| පරිගණක → | නිමැවුම් ඒකක 1/8 | නිමැවුම්ඒකක 1/12 |
| දුරකථන → | නිමැවුම් ඒකක 1/6 | නිමැවුම් ඒකක 1/4 |

- ජපානයට ශ්‍රම ඒකයකින් නිපදවිය හැකි පරිගණක ඒකක ප්‍රමාණය 1/8 ද ඉන්දියාවට ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි පරිගණක ඒකක ප්‍රමාණය 1/12 ද වේ. මේ අනුව **ජපානයට පරිගණක නිපදවීමේ නිරපේක්ෂ වාසි පවතී.**
- දුරකථන නිපදවීම සම්බන්ධ ගත් විට ජපානය ශ්‍රම ඒකයකින් නිපදවිය හැකි දුරකථන ඒකක ප්‍රමාණය 1/6 ද. ඉන්දියාව ශ්‍රම ඒකයකින් නිපදවිය හැකි දුරකථන ඒකක ප්‍රමාණය 1/4 ද වේ. මේ අනුව **ඉන්දියාවට දුරකථන නිපදවීමේ නිරපේක්ෂ වාසි පවතී.**
- මේ අනුව ජපානයට පරිගණක නිපදවීම සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසි පවතින අතර ඉන්දියාවට දුරකථන නිපදවීම සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසි පවතී.
- දෙරටම විදේශ වෙළඳාමට සම්බන්ධ වන විට ජපානය ඉන්දියාවට පරිගණක අපනයනය කරන අතර ඉන්දියාව ජපානයට දුරකථන අපනයනය කිරීමෙනුත් දෙරටටම වාසි සහගත විදේශ වෙළඳාමක් සිදු වේ ශ්‍රම ඒකයකින් නිපදවිය හැකි භාණ්ඩ ප්‍රමාණය අඩු භාණ්ඩ දෙරටම ආනයනය කිරීමෙන් දෙරටම වාසි අත්කර ගනී.

## නිරපේක්ෂ වාසි හටගැනීම කෙරෙහි බලපාන හේතු (මූලාශ්‍ර)

- දේශගුණයේ සුවිශේෂීත්වය
- සම්පත් උරුමය
- සාධක සුලබතාවය
- කීර්තිනාමය
- ඓතිහාසික හේතු

**නිරපේක්ෂ වාසි න්‍යායේ ප්‍රධානම ගැටළුව *උදාහරණයක් ඇසුරෙන් සලකා බලමු* :-**

ශ්‍රම ඒකකයකින් බිහිවන නිමැවුම් ඒකක ප්‍රමාණය

| භාණ්ඩය | X රට | Y රට |
|---|---|---|
| පරිගණක → | 10 | 4 |
| දුරකථන → | 8 | 6 |

ඉහත උදාහරණයට අනුව X රටට භාණ්ඩ වර්ග දෙකම නිෂ්පාදනය සම්බන්ධයෙන් **නිරපේක්ෂ වාසි පවතින අතර** Y රටට කිසිදු භාණ්ඩයක් සම්බන්ධයෙන් **නිරපේක්ෂ වාසි නොපවතී.** මේ නිසා **නිරපේක්ෂ වාසි න්‍යාය අනුව** X හා Y රටවල් අතර වෙළෙඳාමක් සිදු නොවේ.

නිරපේක්ෂ වාසි න්‍යායේ පවතින මෙම දුර්වලතාවය ඉවත් කිරීම සඳහා **සාපේක්ෂ වාසි න්‍යාය ඉදිරිපත් වී ඇත.**

### සාපේක්ෂ වාසි න්‍යාය (PRINCIPAL OF COMPARATIVE ADVANTAGE) - DEVID RECARDO– 1817

කිසියම් රටකට කිසියම් භාණ්ඩයක් වෙනත් රටකට සාපේක්ෂව අඩු ආවස්ථික පිරිවැයක් යටතේ නිෂ්පාදනය කළ හැකිනම් එකී රටට එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා වාසි පවතින බවත් කිසියම් රටකට කිසියම් භාණ්ඩයක් නිපදවීමේ දී වෙනත් රටකට සාපේක්ෂව වැඩි ආවස්ථික පිරිවැයක් දැරීමට සිදු වේ නම් එම රටට එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා සාපේක්ස අවාසි පවතින බවත් සාපේක්ෂ වාසි න්‍යායෙන් ප්‍රකාශ කෙරේ.

**රටක් තමන්ට සාපේක්ෂ වශයෙන් අඩු ආවස්ථික පිරිවැයක් යටතේ නිපදවිය හැකි භාණ්ඩ පිළිබඳව විශේෂීකරණය කොට ඒවා අපනයනය කළ යුතු බවත් සාපේක්ෂ වශයෙන් වැඩි ආවස්ථික පිරිවැයක් යන භාණ්ඩ ආනයනය කළ යුතු බවත් මෙම න්‍යාය මගින් පෙන්වා දේ.**

**සාපේක්ෂ වාසි න්‍යාය පදනම් කරගනු ලබන උපකල්පන**

- පූර්ණ සාධක සංජවලතාව
- ස්ථාවර පරිමාණානුකූල ඵල
- නිෂ්පාදනය හෝ පරිභෝජනය ආශ්‍රයෙන් බාහිරතා හට නොගනී
- ප්‍රවාහණ පිරිවැය සැලකිල්ලට නොගැනීම

සාපේක්ෂ වාසි න්‍යාය හඳුනාගැනීම සඳහා භාවිතා කළ හැකි ප්‍රවේශ දෙකකි.

- නිමැවුම් ප්‍රවේශය
- යෙදවුම් ප්‍රවේශය

## නිමැවුම් ප්‍රවේශය

නිමැවුම් ප්‍රවේශය යන්නෙන් අදහස් වන්නේ කිසියම් යෙදවුම් ඒකකයකින් නිපදවිය හැකි නිමැවුම් ඒකක ප්‍රමාණය මත පදනම් වෙමින් භාණ්ඩ වර්ග දෙකක් සහා සම්බන්ධ රටවල් දෙකෙහි ආවස්ථික පිරිවැය ගණනය කොට එම ආවස්ථික පිරිවැය සැලකිල්ලට ගනිමින් දෙරටටම වෙළඳාමට සම්බන්ධ විය හැකි ආකාරය පෙන්වා දේ.

### නිමැවුම් ප්‍රවේශය සඳහා උදාහරණයක් :-

ශ්‍රම ඒකකයකින්

නිපදවිය හැකි නිමැවුම් ඒකක ප්‍රමාණය

| භාණ්ඩය | ජර්මනිය | ප්‍රංශය |
|---|---|---|
| ඔර්ලෝසු → | නිමැවුම් ඒකක 2 | නිමැවුම්ඒකක 10 |
| විදුලි පංකා → | නිමැවුම් ඒකක 3 | නිමැවුම් ඒකක 5 |

**ඔර්ලෝසු ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය**

ජර්මනිය $= \frac{\text{කැප කිරීම}}{\text{තෝරා ගැනීම}} = \frac{3}{2} = 1.5$

ප්‍රංශය $= \frac{\text{කැප කිරීම}}{\text{තෝරා ගැනීම}} = \frac{5}{10} = 0.5$

ජර්මනියේ ඔර්ලෝසු ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය විදුලි පංකා ඒකක 1.5 ක් වන අතර ප්‍රංශය ඔර්ලෝසු ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය විදුලි පංකා ඒකක 0.5 ක් වේ.

මේ අනුව ප්‍රංශයට ඔර්ලෝසු නිපදවීම සම්බන්ධයෙන් අඩු ආවස්ථික පිරිවැයක් පවතින අතර ජර්මනියට ඔර්ලෝසු නිපදවීම සම්බන්ධයෙන් වැඩි ආවස්ථික පිරිවැයක් පවතී.

- මේ අනුව ඔර්ලෝසු නිපදවීම සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි හිමි වන්නේ අඩු ආවස්ථික පිරිවැයක් යටතේ **ඔර්ලෝසු නිපදවන ප්‍රංශයටයි.**

**විදුලි පංකා ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය**

ජර්මනිය $= \frac{\text{කැප කිරීම}}{\text{තෝරා ගැනීම}} = \frac{2}{3} = 0.67$

ප්‍රංශය $= \frac{\text{කැප කිරීම}}{\text{තෝරා ගැනීම}} = \frac{10}{5} = 2$

ජර්මනියේ විදුලි පංකා ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය ඔර්ලෝසු ඒකක 0.67 ක් වන අතර ප්‍රංශය විදුලි පංකා ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය ඔර්ලෝසු ඒකක 2 ක් වේ.

මේ අනුව ර ජර්මනියට විදුලි පංකා නිපදවීම සම්බන්ධයෙන් අඩු ආවස්ථික පිරිවැයක් පවතින අතර ප්‍රංශයට විදුලි පංකා නිපදවීම සම්බන්ධයෙන් වැඩි ආවස්ථික පිරිවැයක් පවතී.

- විදුලි පංකා නිපදවීම සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි හිමි වන්නේ අඩු ආවස්ථික පිරිවැයක් යටතේ **විදුලි පංකා නිපදවන ජර්මනියටයි.**

ප්‍රංශය අඩු ආවස්ථික පිරිවැයක් සහිතව ඔර්ලෝසු නිෂ්පාදනය විශේෂීකරණය කර අතිරික්තය ජර්මනියට අපනයනය කරන අතර, ජර්මනිය අඩු ආවස්ථික පිරිවැයක් සහිතව නිපදවිය හැකි විදුලි පංකා නිෂ්පාදනය විශේෂීකරණය කර අතිරික්තය ප්‍රංශයට අපනයනය කිරීමෙන් දෙරටටම වාසි ලබාගත හැකි වේ.

**සාපේක්ෂ වාසි න්‍යායට අනුව අන්තර්ජාතික වෙළඳාමට ප්‍රවේශ වීමේ ප්‍රධාන වාසි**

- විශේෂීකරණයෙන් ලැබෙන වාසි
- භුවමාරුවෙන් ලැබෙන වාසි

## අභ්‍යන්තරික හුවමාරු අනුපාතය සහ බාහිර හුවමාරු අනුපාතය

එක් එක් රට සාපේක්ෂ වාසි ඇති භාණ්ඩය නිෂ්පාදනය විශේෂීකරණය කර අතිරික්ත නිෂ්පාදනය රටවල් අතර හුවමාරු කරගනු ලබන්නේ කිසියම් අනුපාතයක් අනුවය. මෙසේ යම් අනුපාතයක් යටතේ හුවමාරුව සිදු කරනු ලබන්නේ ඒ ඒ හුවමාරුවෙන් දෙරටටම වාසි අත් වන්නේ නම් පමණි.

දෙරටටම අන්‍යෝන්‍ය වශයෙන් වාසි සහගත හුවමාරු අනුපාතය ගණනය කිරීමේ දී ඊට අදාළ වන හුවමාරු අනුපාත දෙකක් පවතී.

එනම් ,

I . අභ්‍යන්තරික හුවමාරු අනුපාතය

ii . බාහිර හුවමාරු අනුපාතය

<u>අභ්‍යන්තර හුවමාරු අනුපාතය</u>

විදේශ වෙළඳාමට පෙර ඒ ඒ රට ඇතුළත නිපදවන භාණ්ඩ 2 ක් අතර හුවමාරු අනුපාතිකයයි. නැතිනම් ආවස්ථික පිරිවැය අනුපාතිකයයි. එසේත් නැතිනම් එක් භාණ්ඩයක මිල අනෙක් භාණ්ඩයෙන් ප්‍රකාශ කිරීමයි. මෙමගින් දැක්වෙන්නේ රටක් තුළ එක් නිෂ්පාදන අංශයක සිට තවත් නිෂ්පාදන අංශයකට මාරු වීමේ දී කැපකළ යුතු භාණ්ඩ ප්‍රමාණයයි.

අභ්‍යන්තරික හුවමාරු අනුපාතය ගණනය කරන ආකාරය උදාහරණයක් ඇසුරෙන් සලකා බලමු.

ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි නිමැවුම් ඒකක ප්‍රමාණය

| භාණ්ඩය | ජර්මනිය | ප්‍රංශය |
|---|---|---|
| ඔර්ලෝසු | නිමැවුම් ඒකක 2 | නිමැවුම්ඒකක 10 |
| විදුලි පංකා | නිමැවුම් ඒකක 3 | නිමැවුම් ඒකක 5 |

**ජර්මනයේ අභ්‍යන්තර හුවමාරු අනුපාතය**

ඔර්ලෝසු 2 : විදුලි පංකා 3

ඔර්ලෝසු 1 : විදුලි පංකා 1.5

**1 : 1.5**

ඔර්ලෝසු

**1 : 1.5**

විදුලි පංකා

**1 : 0.67**

විදුලි පංකා 3: ඔර්ලෝසු 2

විදුලි පංකා 1: ඔර්ලෝසු 0.67

**1 : 0.67**

**ප්‍රංශයේ අභ්‍යන්තර හුවමාරු අනුපාතය**

ඔර්ලෝසු 10 : විදුලි පංකා 5

ඔර්ලෝසු 1 : විදුලි පංකා 0.5

**1 : 0.5**

ඔර්ලෝසු

**1 : 0.5**

විදුලි පංකා

**1 : 2**

විදුලි පංකා 5: ඔර්ලෝසු 10

විදුලි පංකා 1: ඔර්ලෝසු 2

**1 : 2**

දෙරටේ භාණ්ඩ වර්ග දෙකෙහි ආවස්ථික පිරිවැය තත්වයන් සැලකිල්ලට ගැනීමේදී ජර්මනියට ඔර්ලෝසු සම්බන්ධවත් ප්‍රංශයට විදුලි පංකා සම්බන්ධවත් සාපේක්ෂ වාසි පවතී. සාපේක්ෂ වාසි ඇති භාණ්ඩය විශේෂීකරණය කරමින් විදේශ වෙළඳාමට සම්බන්ධවීමට නම් **අභ්‍යන්තර හුවමාරු අනුපාතයට වඩා වාසිදායක අනුපාතයක් මත භාණ්ඩ හුවමාරු කරගත හැකි විය යුතුය.ඉහත උදාහරණයට අනුව** විදේශ වෙළඳාමට සම්බන්ධවීමට නම් පහත සඳහන් පරාසයන් තුළ වෙළඳාම සිදු විය යුතු වේ

ජර්මනියේ, ඔර්ලෝසු සඳහා_අභ්‍යන්තර හුවමාරු අනුපාතය

**1 : 1.5**

ප්‍රංශයේ, ඔර්ලෝසු සඳහා_අභ්‍යන්තර හුවමාරු අනුපාතය

**1 : 0.5**

ප්‍රංශයට , ඔර්ලෝසු **1** කට, විදුලි පංකා **0.5** ට වැඩි සහා **1.5** ට අඩු විය යුතු වන අතර → **(0.5< 1.5)**

ප්‍රංශයේ, විදුලි පංකා සඳහා_අභ්‍යන්තර හුවමාරු අනුපාතය

**1 : 2**

ජර්මනියේ, විදුලි පංකා සඳහා_අභ්‍යන්තර හුවමාරු අනුපාතය

**1 : 0.67**

ජර්මනියට , විදුලි පංකා **1** කට , ඔර්ලෝසු **0.67** ට වැඩි සහා **2** ට අඩු විය යුතු වේ → **(0.67< 2)**

බාහිර හුවමාරු අනුපාතය

වෙළඳාමට සම්බන්ධ වීම නිසා දෙරට භාණ්ඩ හුවමාරු වන අනුපාතය බාහිර හුවමාරු අනුපාතය ලෙස හඳුන්වයි

අභ්‍යන්තර හුවමාරු අනුපාතයට වාසිදායක තත්වයක් වන පරිදි බාහිර හුවමාරු අනුපාතය තීරණය කර ගනී

ප්‍රංශයට , ඔර්ලෝසු **1** කට → **(0.5< 1.5)**

ජර්මනියට , විදුලි පංකා **1** කට → **(0.67< 2)**

මෙම පරාසය තුළ බාහිර හුවමාරු අනුපාත බොහෝ ප්‍රමාණයක් තිබිය හැකිය එම ඕනෑම අනුපාතයක් යටතේ හුවමාරුව සිදුකර ගැනීමෙන් වෙළෙඳාමට සම්බන්ධ වී දෙරටටම වාසි අත් කර ගත හැකිය එනම් ඉහළ පරිභෝජන මට්ටමකට ළඟා විය හැකිය

ජර්මනිය හා ප්‍රංශයල ඉහත පරාසයට අයත්වන

ඔර්ලෝසු 1: විදුලි පංකා 1

බාහිර හුවමාරු අනුපාතය යටතේ වෙළෙඳාමට ප්‍රවේශ වන්නේ යැයි සිතමු. එවිට දෙරට විදේශ වෙළඳාමට පෙර සිටියාට වඩා ඉහළ පරිභෝජන මට්ටමක් කරා ළඟා වේ.

ඔර්ලෝසු 1: විදුලි පංකා 1

ප්‍රංශයට , ඔර්ලෝසු ඒකක1 කට අභ්‍යන්තර හුවමාරු අනුපාතය යටතේ ලබා ගත හැකි වුයේ විදුලි පංකා ඒකක 0.5 කි නමුත් (ඔර්ලෝසු 1: විදුලි පංකා 1) බාහිර හුවමාරු අනුපාතය යටතේ ප්‍රංශයට , ඔර්ලෝසු ඒකක1 ක් සඳහා විදුලි පංකා ඒකක 1 ක් ලබා ගැනීමේ හැකියාවක් පවතී මෙහිදී ප්‍රංශයට බාහිර හුවමාරු අනුපාතය යටතේ විදුලි පංකා ඒකක 0.5 ක වාසියක් අත්කර ගත හැකිය


ජර්මනියට, විදුලි පංකා ඒකක1 කට අභ්‍යන්තර හුවමාරු අනුපාතය යටතේ ලබා ගත හැකි වුයේ ඔර්ලෝසු ඒකක 0.67 කි නමුත් (ඔර්ලෝසු 1: විදුලි පංකා 1) බාහිර හුවමාරු අනුපාතය යටතේ ජර්මනියට, විදුලි පංකා ඒකක1 ක් සඳහා ඔර්ලෝසු ඒකක 1 ක් ලබා ගැනීමේ හැකියාවක් පවතී මෙහිදී ජර්මනියට බාහිර හුවමාරු අනුපාතය යටතේ ඔර්ලෝසු ඒකක 0.37 ක වාසියක් අත්කර ගත හැකිය

- විදේශ වෙළඳාමට වාසිදායක බාහිර හුවමාරු අනුපාතයක් යටතේ සම්බන්ධ වීමෙන් දෙරටෙහිම පරිභෝජන මට්ටම ඉහළ යන ආකාරය නිෂ්පාදන හැකියා වක්‍ර සහ පරිභෝජන වක්‍ර තුළින් පහත සඳහන් පරිදි සොයා බැලිය හැකිය


  විදේශ වෙළඳාමට සම්බන්ධ වීමට පෙර නිෂ්පාදන හැකියා වක්‍ර

| භාණ්ඩය | ප්‍රංශය | ජර්මනිය |
|---|---|---|
| ඔර්ලෝසු | නිමැවුම් ඒකක 2 | නිමැවුම් ඒකක 10 |
| විදුලි පංකා | නිමැවුම්ඒකක 3 | නිමැවුම් ඒකක 5 |

ප්‍රංශය




ජර්මනිය






අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායි බාහිර හුවමාරු අනුපාතයක් යටතේ වෙළඳාමට සම්බන්ධ වී හුවමාරු වාසි ( ඉහළ පරිභෝජන මට්ටමක් කරා ළඟා කර ගැනීම) ළඟා කර ගන්නා සේම වෙළෙඳාමට ප්‍රවේශ වීම නිසා විශේෂීකරණයේ වාසි ද ලබා ගත හැකිය

විශේෂීකරණයේ වාසි යනු() මුළු සම්පත් ප්‍රමාණයේ ඉහළ යාමකින් තොරව ලෝක නිෂ්පාදනය වැඩි කර ගත හැකි වීමයි

:ඔර්ලෝසු 1: විදුලි පංකා 1) බාහිර හුවමාරු අනුපාතය යටතේ සාපේක්ෂ වාසි භාණ්ඩය හුවමාරු කර ගැනීම නිසා දෙරටම නව පරිභෝජන හැකියා වක්‍රයක් කරා ළඟා වන ආකාරය පහත සඳහන් රූපසටහන ඇසුරෙන් අවබෝධ කර ගත හැකිය

ප්‍රංශය ජර්මනිය





ප්‍රංශය හා ජර්මනිය යන දෙරටම මුළු සම්පත් ලෙසින් ශ්‍රම ඒකක 100 බැගින් පවතින බව ද එම ශ්‍රම ඒකක 100 යොදා නිෂ්පාදනය කළහැකි **ඔර්ලෝසු සහ විදුලි පංකා පිළිබඳ තොරතුරු පහත වගුවෙන් දැක්වේ**


| භාණ්ඩය | ප්‍රංශය | ජර්මනිය |
|---|---|---|
| ඔර්ලෝසු | නිමැවුම් ඒකක 10 | නිමැවුම් ඒකක 2 |
| විදුලි පංකා | නිමැවුම් ඒකක 5 | නිමැවුම් ඒකක 3 |

| භාණ්ඩය | ප්‍රංශය | ජර්මනිය |
|---|---|---|
| ඔර්ලෝසු | නිමැවුම්ඒකක1000 | නිමැවුම් ඒකක200 |
| විදුලි පංකා | නිමැවුම් ඒකක 500 | නිමැවුම් ඒකක300 |

**ශ්‍රම ඒකක 100 කින් බිහිවන නිමැවුම් ඒකක ප්‍රමාණය**

**ප්‍රංශය හා ජර්මනිය ස්වයං පෝෂිත ආර්ථිකයක් තුළ භාණ්ඩ වර්ග 2 න් දේශීය නිමැවුම් සංයෝග සැලසුම් කර ඇති ආකාරය රූප සටහන් තුළින් දැකිවේ**



**මෙසේ රටවල් 2 විදේශ වෙළෙඳාමට ප්‍රවේශ වීමට පෙර ඔර්ලෝසු සහ විදුලි පංකා ලෝක නිෂ්පාදන තත්වය පහත වගුවෙන් දැක්වේ**

| භාණ්ඩය | ප්‍රංශය | ජර්මනිය | ලෝක නිෂ්පාදන |
|---|---|---|---|
| ඔර්ලෝසු | 500 | 100 | 600 |
| විදුලි පංකා | 200 | 50 | 250 |

විදේශ වෙළෙඳාමට ප්‍රවේශ වීමෙන් ප්‍රංශය ඔර්ලෝසු ද ජර්මනිය විදුලි පංකා දල **ශ්‍රම ඒකක 100 ම භාවිතා කර පූර්ණ විශේෂීකරණය කිරීමෙන්** ලැබෙන අතිරික්තය අනෙක් රටට අපනයනය කිරීමෙන් ලෝක නිෂ්පාදනයේ ඉහළ යාම පහත වගුවෙන් දැක්වේ.

| භාණ්ඩය | ප්‍රංශය | ජර්මනිය | ලෝක නිෂ්පාදනය | ලෝක නිෂ්පාදනය ඉහළ යාම |
|---|---|---|---|---|
| ඔර්ලෝසු | 1000 | 0 | 1000 | 1000-600 = **400** |
| විදුලි පංකා | 0 | 300 | 300 | 300-250 = **400** |

විදේශ වෙළෙඳාමට පෙර ඔර්ලෝසුවල ලෝක නිෂ්පාදනය **ඒකක 600 ක් වුව ද** විදේශ වෙළෙඳාමෙක් පසුව ඔර්ලෝසුවල ලෝක නිෂ්පාදනය **ඒකක 1000** දක්වා ඉහළ ගොස් ඇතග එනම් වෙළෙඳාමට ප්‍රවේශ වීම නිසා ඔර්ලෝසුවල ලෝක නිෂ්පාදනය **ඒකක 400 කි න්** ඉහළ ගොස් ඇත.

එසේම විදේශ වෙළෙඳාමට පෙර විදුලි පංකා වල ලෝක නිෂ්පාදනය **ඒකක 250 ක් වුව ද** විදේශ වෙළෙඳාමෙක් පසුව විදුලි පංකාවල ලෝක නිෂ්පාදනය **ඒකක 300** දක්වා ඉහළ ගොස් ඇතග එනම් වෙළෙඳාමට ප්‍රවේශ වීම නිසා විදුලි පංකාවල ලෝක නිෂ්පාදනය **ඒකක 50 කි න්** ඉහළ ගොස් ඇත.

**නිගමනය**

**වෙළෙඳාමට පෙරත් පසුත් දෙරටෙහිම පැවති ශ්‍රම සම්පත වෙනස් වීමකින් තොරව විදේශ වෙළෙඳාමට ප්‍රවේශ වී සාපේක්ෂව වාසි භාණ්ඩය පූර්ණ විශේෂීකරණය කිරීමෙන් ලෝක නිෂ්පාදනය වැඩි කරගත හැකි බව ඉහත උදාහරණයෙන් පැහැදිලි වේ. එය විශේෂීකරණයේ වාසියයි .**

<u>භාණ්ඩයක් නිපදවීම සඳහා අවශ්‍ය යෙදවුම් ඒකක ප්‍රමාණය දුන් විට ආවස්ථික පිරිවැය ඇසුරෙන් සාපේක්ෂව වාසි ගණනය කිරීම</u>

***යෙදවුම් ප්‍රවේශය සඳහා උදාහරණයක් :-***

නිමැවුම් ඒකකයක්

නිපදවීම සඳහා අවශ්‍ය ශ්‍රම ඒකක ප්‍රමාණය

| භාණ්ඩය | ජර්මනිය | ප්‍රංශය |
|---|---|---|
| ඔර්ලෝසු → | ශ්‍රම ඒකක 2 | ශ්‍රම ඒකක 10 |
| විදුලි පංකා → | ශ්‍රම ඒකක 4 | ශ්‍රම ඒකක 5 |

යෙදවුම් ප්‍රමාණය දී ඇති විට සාපේක්ෂ වාසි සෙවීම සඳහා එම තොරතුරු යෙදවුම් ඒකකයකින් බිහි කළ හැකි නිමැවුම් ප්‍රමාණය දැක්වෙන **පරිදි පරිවර්තනය** කරගත යුතුය

ශ්‍රම ඒකකයකින්

නිපදවිය හැකි නිමැවුම් ඒකක ප්‍රමාණය

| භාණ්ඩය | ජර්මනිය | ප්‍රංශය |
|---|---|---|
| ඔර්ලෝසු → | ශ්‍රම ඒකක 1/2 | ශ්‍රම ඒකක 1/10 |
| විදුලි පංකා → | ශ්‍රම ඒකක 1\4 | ශ්‍රම ඒකක 1/5 |

<u>ඔර්ලෝසු ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය</u>

ජර්මනිය = ——— = $\frac{1\backslash 4}{1/2}$ = ¼÷½=¼×2 = **0.5**

ප්‍රංශය = ——— = $\frac{\frac{1}{5}}{\frac{1}{10}}$ 1/5÷1/10= 1/5×10/1= 2

විදුලි පංකා <u>ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය</u>

ජර්මනිය = $\frac{\text{කැප කිරීම}}{\text{තෝරා ගැනීම}}$ = $\frac{1\backslash 2}{1/4}$ ½÷¼=½×4 = **2**

ප්‍රංශය = $\frac{\text{කැප කිරීම}}{\text{තෝරා ගැනීම}}$ = $\frac{1\backslash 4}{1/2}$ ¼÷½=¼×2 = **0.5**

**මෙහිදී ජර්මනිය ඔර්ලෝසු නිපදවීමට ද ප්‍රංශය විදුලි පංකා නිපදවීමට ද සාපේක්ෂ වාසි පවතී**

**ජර්මනිය** අඩු ආවස්ථික පිරිවැයක් සහිත **ඔර්ලෝසු** නිෂ්පාදනය විශේෂීකරණය කර අතිරික්තය ජර්මනියට අපනයනය කිරීමෙන් ද, **ප්‍රංශය** අඩු ආවස්ථික පිරිවැයක් සහිතව නිපදවිය හැකි **විදුලි පංකා** නිෂ්පාදනය විශේෂීකරණය කර අතිරික්තය ප්‍රංශයට අපනයනය කිරීමෙන් ද දෙරටටම වාසි ලබාගත හැකි වේ.

එහිදී **ජර්මනිය විදුලි පංකා ද ප්‍රංශය ඔර්ලෝසු ද අඩු පිරිවැයක් යටතේ ආනයනය කර පරිභෝජනයේ වාසි අත්පත් කර ගනී.**

## අන්තර්ජාතික වෙළඳාමට පදනම වන සාපේක්ෂ වාසි හට ගන්නා ප්‍රධාන මූලාශ්‍ර (සාපේක්ෂ වාසි හට ගැනීමට හේතු)

- සම්පත් සම්භාරයේ වෙනස්කම්
- ගුණාත්මක තත්ත්වය
- අභිරුචියේ වෙනස්කම්
- පරිමාණුකූල පිරිමැසුම
- නිෂ්පාදන ප්‍රභේදනය
- තාක්ෂණික වෙනස්කම්
- රාජ්‍ය ප්‍රතිපත්ති
- උද්ධමනය
- ස්ථානගත වීම

***සම්පත් සම්භාරයේ වෙනස්කම්***

රටක් උරුම කරගත් සම්පත් සම්භාරයේ වෙනස්කම් නිසා භාණ්ඩ නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැයේ වෙනස්කම් හට ගනී.

**නිදසුන්**:-

ඛනිජ සම්පත් සුලබතාව රටින් රටට වෙනස්ය. දකුණු අප්‍රිකාවේ රත්රන් සුලබය. මේ නිසා සෞදි අරාබියේ ඛනිජ තෙල් සුලබය. මේ නිසා සෞදි අරාබියේ ඛනිජ තෙල් නිෂ්පාදනය සඳහා අඩු ආවස්ථික පිරිවැයක් පවතින බැවින් ඛනිජ තෙල් විශේෂීකරණය කොට අපනයනය කරයි. එසේ ම දකුණු අප්‍රිකාවේ රත්තරන් වල ආවස්ථික පිරිවැය අඩු නිසා රත්තරන් විශේෂීකරණය කොට අපනයනය කරයි.

***ගුණාත්මක තත්ත්වය***

සම්පත් ප්‍රමාණය අතින් පමණක් නොව සම්පත් වල ගුණාත්මක තත්ත්වය අතින් ද රටවල් අතර වෙනස්කම් පවතී. නිදසුනක් වශයෙන් ශ්‍රමය බහුල රටක් වුව ද ශ්‍රම හමුදාව නුපුහුණු නම් ඔවුන් ගේ ඵලදායිතාව පහළ මට්ටමක පවතී. එහෙත් ශ්‍රමය අඩු රටක සිටින ශ්‍රම හමුදාව මනා පුහුණුවක් ලබා තිබේ නම් ඔවුන් ඉහළ ඵලදායිතාවයකින් යුක්තය. මෙහිදී ශ්‍රමයේ ඵලදායිතාව අඩු වන විට ආවස්ථික පිරිවැය වැඩි නිසා සාපේක්ෂව වාසි අඩු වේ. එහෙත් ශ්‍රමයේ ඵලදායිත්වය ඉහළ යන විට නිපදවන භාණ්ඩවල ආවස්ථික පිරිවැය අඩු නිසා සාපේක්ෂව වාසි ඇති වේ.

***අභිරුචියේ වෙනස්කම්***

සියලු ම රටවල් එක හා සමාන කාර්යක්ෂමතාවයකින් හා සමාන සම්පත් සම්භාරයක් උරුම කර සිටියත්, රටවල් අතර භාණ්ඩ සම්බන්ධයෙන් පවතින අභිරුචියේ වෙනස්කම් නිසා ද ආවස්ථික පිරිවැයෙහි වෙනස්කම් හට ගනී. රටවල පවත්නා සම්පත් ප්‍රමාණය සමාන වුවත් අභිරුචි රටාවන් හි වෙනස්කම් නිසා භාණ්ඩවල සාපේක්ෂ මිල ගණන් අතර වෙනස්කම් ඇති විය හැකිය. අභිරුචීන් වැඩි භාණ්ඩ නිපදවීමට වැඩි දිරිගැන්වීම් ලැබීම තුළින් අඩු ආවස්ථික පිරිවැයක් යටතේ එම භාණ්ඩ නිපදවා අපනයනය කොට වාසි අත් කර ගත හැකි ය.

***පරිමාණානුකූල පිරිමැසුම්***

නිෂ්පාදන ධාරිතාව වැඩි කරන විට ඒකක පිරිවැය පහළ වැටේ නම් පරිමාණුකූල පිරිමැසුම් පවතින විට සාපේක්ෂ ව අඩු ආවස්ථික පිරිවැයක් සහිතව භාණ්ඩ නිපදවිය හැකි බැවින් ඒ සම්බන්ධව සාපේක්ෂ වාසි අත් කර ගත හැකි ය.

***නිෂ්පාදන ප්‍රභේදනය***

එකම කර්මාන්තය තුළ භාණ්ඩ අතර පවතින විවිධ වෙනස්කම් නිසා ද අන්තර්ජාතික වෙළඳාම තුළින් ලැබිය හැකි සාපේක්ෂ වාසි පිළිබිඹු වේ. වර්තමානයේ සංවර්ධිත රටවල් බොහොමයක් විදේශ වෙළඳාමෙන් වැඩි ප්‍රමාණයක් මෙම භාණ්ඩ නිෂ්පාදනය මුල් කර ගෙන සිදු වන බව දක්නට ලැබේ. නිදසුන් වශයෙන් මෝටර් රථ කර්මාන්තය ගත් විට ජර්මනිය මහා බ්‍රිතාන්‍යයට මෝටර් රථ අපනයනය කොට මහා බ්‍රිතාන්‍යයෙන් මෝටර් රථ ආනයනය ද කරයි. ඊට හේතුව එකම කර්මාන්තය වුවත් භාණ්ඩ අතර පවතින වෙනස්කම් නිසා ආවස්ථික පිරිවැයෙහි වෙනස්කම් නිසා ආවස්ථික පිරිවැයෙහි වෙනස්කම් රටවල් අතර ඇතිවීමයි.

***තාක්ෂණික වෙනස්කම්***

තාක්ෂණයේ හට ගන්නා වෙබස්කම් නිසා ද රටවල් අතර සාපේක්ෂ වාසි වෙනස් වේ. කිසියම් රටක් කිසියම් භාණ්ඩයක් නිපදවීම සම්බන්ධයෙන් පෙරට වඩා නව තාක්ෂණයක් භාවිත කිරීමට හැකි වේ නම් සාපේක්ෂ වශයෙන් අඩු ආවස්ථික පිරිවැයකින් එම භාණ්ඩය විශේෂීකරණය කොට නිපදවා සාපේක්ෂ වාසි ලබා ගත හැකි ය.

***රාජ්‍ය ප්‍රතිපත්ති***

රාජ්‍ය ප්‍රතිපත්තිය මගින් ද සාපේක්ෂ වාසි නිර්මාණය කල හැකි ය. කිසියම් කර්මාන්තයක් පුනර්ජීවනය සඳහා ආණ්ඩුවක් විසින් බදු සානුබල පර්යේෂණ හා සංවර්ධනය සඳහා සහනාධාර ලගා දීම ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අඩු පොළී ණය යනාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන විට අඩු ආවස්ථික පිරිවැයකින් භාණ්ඩ නිපදවීම හා වෙළඳාම මගින් සාපේක්ෂ වාසි අත් කර ගැනීමට හැකි වේ.

***උද්ධමනය***

කිසියම් රටක දිගු කාලීන උද්ධමන අනුපාතයක් පවතින විට භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය ඉහළ යයි. ඒ අනුව සාපේක්ෂ වාසි අඩු වේ. අපනයනය ද අධෛර්යමත් වේ.

***ස්ථානගත වීම***

කිසියම් කර්මාන්තයක් ස්ථානගත වී ඇති ආකාරය අනුව ද ඒ ඒ රටවල සාපේක්ෂ වාසි තීරණය වේ. කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය සියල්ල පහසුවෙන් ලබා ගත හැකි ආකාරයෙන් කර්මාන්ත ස්ථානගත වී තිබේ නම් සාපේක්ෂ අඩු ආවස්ථික පිරිවැයක් යටතේ භාණ්ඩ නිපදවමින් සාපේක්ෂ වාසි ලබා ගැනිමට හැකි වේ.

***රාජ්‍ය ප්‍රතිපත්ති***

රාජ්‍ය ප්‍රතිපත්තිය මගින් ද සාපේක්ෂ වාසි නිර්මාණය කල හැකි ය. කිසියම් කර්මාන්තයක් පුනර්ජීවනය සඳහා ආණ්ඩුවක් විසින් බදු සානුබල පර්යේෂණ හා සංවර්ධනය සඳහා සහනාධාර ලබා දීම ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අඩු පොළී ණය යනාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන විට අඩු ආවස්ථික පිරිවැයකින් භාණ්ඩ නිපදවීම හා වෙළඳාම මගින් සාපේක්ෂ වාසි අත් කර ගැනීමට හැකි වේ.

***උද්ධමනය***

කිසියම් රටක දිගු කාලීන උද්ධමන අනුපාතයක් පවතින විට භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය ඉහළ යයි. ඒ අනුව සාපේක්ෂ වාසි අඩු වේ. අපනයනය ද අධෛර්යවත් වේ.

***ස්ථානගත වීම***

කිසියම් කර්මාන්තයක් ස්ථානගත වී ඇති ආකාරය අනුව ද ඒ ඒ රටවල සාපේක්ෂ වාසි තීරණය වේ. කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය සියල්ල පහසුවෙන් ලබා ගත හැකි ආකාරයෙන් කර්මාන්ත ස්ථානගත වී තිබේ නම් සාපේක්ෂ අඩු ආවස්ථික පිරිවැයක් යටතේ භාණ්ඩ නිපදවමින් සාපේක්ෂ වාසි ලබා ගැනිමට හැකි වේ.

- තරඟකාරීත්වයේ වාසිය යනු කිසියම් භාණ්ඩයක් පාරිභෝගිකයන් වෙත සැපයීමේදී සෙසු තරඟකරුවන්ට වඩා වැඩි

වට්නාකමක් පාරිභෝගිකයන් වෙත ලබා දිය හැකි වීමයි.

- මෙම වට්නාකම සෙසු තරගකරුවන්ට වඩා අඩු මිලක් විය හැකි අතර හැකි නම් ඉහළ මිලක් යටතේ වුවද සෙසු තරගකරුවන්ට වඩා වැඩි ගුණාත්මක සේවාවක් ලබා දිය හැකිය.
- කර්මාන්තය තුළ සිටින සෙසු තරගකරුවන් උපයන සාමාන්‍ය ලාභ ප්‍රමාණයට වඩා වැඩි ලාභ ප්‍රමාණයක් අඛණ්ඩ ව
  උපයා ගැනීමට හැකි නම් එම ආයතනයට තරගකාරිත්ව වාසියක් ඇති බව පෙන්නුම් කෙරේ.
- තරගකාරීත්ව වාසිය තිරසාර ලෙස පවත්වා ගෙන යාම ආයතනයේ උපාය මාර්ගයකි.

***<u>තරගකාරීත්වය වාසියට තුඩු දෙන මූලාශ්‍ර කිහිපයක් පහත දැක්වේ</u>***

- පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයන්හි විශාල හැකියාවක් තිබීම මේ නිසා නව්‍යතා හඳුන්වා දීමේදී ඉදිරියෙව් සිටීමේ හැකියාවලැබේ
- බුද්ධිමය දේපොළ හිමිකාරිත්වය ලැබීම
- බෙදා හැරීමේ ජාල පිළිබඳ සුවිශේෂ හිමිකමක් තිබීම
- ප්‍රාග්ධන උපකරණ හිමිකාරීත්වය

  **නිදසුන්** : ඛනිජ තෙල් ගවේෂණය, පතල් කැණ
- සුපිරි නිෂ්පාදිතයක් බිහි කිරීම හෝ පාරිභෝගික අවශ්‍යතාවක් හෝ අවශ්‍යතාවක් හෝ සඳහාකිසියම් ප්‍රතිචාර දැක්වීමේ හැකියාව
- අඩු පිරිවැයක් සහිතව නිපදවීම
- ඉතා විශාල නිෂ්පාදන ධාරිතාවක් තිබීම
- ශක්තිමත් අලෙවිකරණ උපාය මාර්ග තිබීම
- කාරක ප්‍රාග්ධනය සපයා ගැනීමේ පහසුව
- ඉතා විශිෂ්ට කලමනාකරණ කණ්ඩායම් සිටීම
- ප්‍රවේශය බාධාකාරී වීම හෝ ඒකාධිකාරී ස්වරූපයක් ගැනීම
- අන්තර්ජාතික වෙළඳාමේ වාසි ස්ථිතික වාසි හා ගතික වාසි වශයෙන්ද දැක්විය හැකිය

**ස්ථිතික වාසි යනු නිෂ්පාදනය හා පරිභෝජනය මුල් කරගෙන රටකට ස්වභාවිකව උරුම වී ඇති වාසියකි මෙයට හේතු කිහිපයකි**

- සම්පත් සම්භාරය
- රටවල් අතර අභිරුචීන්ගේ වෙනස්කම්
- නිෂ්පාදනයේ පරිමාණානුකූල පිරිමැසුම් වල විශාල බව

**ගතික වාසිය යනු තාක්ෂණය දියුණුව, භාණ්ඩ ප්‍රභේදනය රාජ්‍ය ප්‍රතිපත්ති වෙළඳ ගිවිසුම් ආදී රටවල් නිර්මාණය කර ගනු ලබන තත්වයක් නිසා හටගන්නා වාසියකි**

## නිපුණතාව 9.2 :

**ආරක්ෂාවාදී ක්‍රියාමාර්ග හා එමගින් නිදහස් වෙළෙඳාමට ඇති කරන බලපෑම විශ්ලේෂණය කරයි**

**ඉගෙනුම් පල :**

- ආරක්ෂණවාදය අර්ථ දක්වයි.
- ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග වෙන් කර දක්වයි.
- තීරු බදු ආරක්ෂණය පැහැදිලි කරයි.
- නාමික ආරක්ෂණ අනුපාතිකය හා සඵල ආරක්ෂණ අනුපාතිකය පැහැදිලි කරයි.
- තීරු බදු නොවන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග සඳහන් කරයි.
- ආරක්ෂණවාදයට පක්ෂ ව හා විපක්ෂ ව ඇති තර්ක ඉදිරිපත් කරයි.

## ආරක්ෂණවාදය යනු

දේශීය වෙළඳපොළට විදේශීය භාණ්ඩ ඇතුළුවීම සීමාකරන හෝ වළක්වන ඕනෑම ක්‍රියා පිළිවෙතක් ම ආරක්ෂණවාදය නමින් හැඳින් වේ

නිදහස් වෙළඳාමට බාධා කරන ආරක්ෂණවාදී ක්‍රියා මාර්ග ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වර්ග කළ හැකිය

- තීරු බදු ආරක්ෂණය
- තීරු බදු නොවන ආරක්ෂණවාදී ක්‍රියා මාර්ග

තීරු බදු ආරක්ෂණය යනු අපනයන හා ආනයන බදු පැනවීමයි. ආනයන මත තීරු බදු පැනවීමෙන් එම භාණ්ඩය මිළදී ගන්නා දේශීය පාරිභෝගිකයින්ට වැඩි මිළක් ගෙවීමට සිදුවීම නිසා ආනයන අධෛර්යමත් වේ. ආනයන තීරු බදු පැනවීමේ ප්‍රධාන අරමුණක් වනුයේ දේශීය නිෂ්පාදකයන් විදේශීය තරගයෙන් ආරක්ෂා කිරීමයි. ආනයනික භාණ්ඩයක් මත තීරු බදු පැන වූ විට දේශීය භාණ්ඩ සඳහා පාරිභෝගිකයින් යොමු වන බැවින් එම භාණ්ඩයේ දේශීය නිෂ්පාදනය ප්‍රසාරණය වේ. මේ නිසා දේශීය භාණ්ඩයේ මිළ ඉහළ නැංවීමට අවස්ථාවක් සැලසේ.

මෙලෙස ආනයන භාණ්ඩ සඳහා ආනයන තීරු බදු වැඩි කිරීමක ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩයට ආනයන කරනු ලබන භාණ්ඩයේ මිළ ඉහළ යාමේ ප්‍රතිශතය තුළින් දේශීය නිෂ්පාදනයට ලැබෙන ආරක්ෂණය **නාමික ආරක්ෂණ අනුපාතය** (Nominal Rate of Protection) වශයෙන් හැඳින් වේ.

නාමික ආරක්ෂණ අනුපාතිකය මඟින් දේශීය නිෂ්පාදකයාගේ මිළ ආනයන කරනු ලබන භාණ්ඩයේ දේශීය වෙළඳපොළේ මිළෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කෙරේ.

නාමික ආරක්ෂණ අනුපාතිකය මඟින් දේශීය භාණ්ඩය වෙත ලැබෙන සැබෑ ආරක්ෂණයේ ප්‍රමාණය නිවැරදිව පිළිබිඹු නොවේ.

නාමික තීරු බදු අනුපාතිකය පනවනු ලබන්නේ ආනයන කරනු ලබන අවසාන භාණ්ඩයේ වටිනාකම අනුවය. නමුත් දේශීය නිෂ්පාදකයන් ආනයන කරනු ලබන අතරමැදි යෙදවුම් හා භාණ්ඩ රැසක් තම නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගනී. මෙම යෙදවුම් හා අතරමැදි භාණ්ඩ මත දතීරු බදු අයකර ඇති විටෙක නාමික තීරු බදු අනුපාතිකයට අනුව ගණනය කරනු ලබන නාමික ආරක්ෂණ අනුපාතිකයෙන් දේශීය නිෂ්පාදකයාට ලැබෙන සැබෑ ආරක්ෂණයේ ප්‍රමාණය නිවැරදිව පිළිබිඹු නොවේ.මේ නිසා ආනයන තීරු බද්දක් පැනවීම මඟින් දේශීය නිෂ්පාදකයාට ලැබෙන සැබෑ ආරක්ෂණයේ ප්‍රමාණය මැනීම සඳහා සඵල ආරක්ෂණ අනුපාතිකය යොදා ගනී.

සඵල තීරු බදු අනුපාතිකයට අනුව සඵල ආරක්ෂණ අනුපාතිකය ගණනය කරනු ලබයි.

සඵල ආරක්ෂණ අනුපාතිකය ගණනය කිරීම සඳහා පහත සූත්‍රය යොදා ගනී.

$$ERP = \frac{(V_1 - V_0)}{V_0} \times 100$$

ERP = සඵල ආරක්ෂණ අනුපාතිකය

V1 = තීරු බද්ද පැනවූ විට දේශීය නිෂ්පාදකයාගේ එකතු කළ අගය

V0 = නිර්බාධ වෙළෙඳපොළ තත්ත්වයක් යටතේ දේශීය නිෂ්පාදනයේ එකතු කළ අගය

නිදසුන 1 :

කිසියම් රටක පාවහන් නිෂ්පාදන ආයතනයක් පාවහන් යුගලයක් රු.5000/- ක මිලකට අලෙවි කරන්නේ යැයි ද එම පාවහන් යුගලය නිපදවීමට අවශ්‍ය යෙදවුම්(සම්,නූල්,ආදී) ආනයනය කිරීම සඳහා රු.3000/ක් වැය කර ඇතැයි ද සිතමු. එවිට දේශීය නිෂ්පාදන ආයතනයේ එකතු කළ වටිනාකම රු.2000/- (5000-3000) කි. එම රට දේශීය ආයතනය නිපදවන පාවහන් යුගලයට සමාන පාවහන් යුගලයක් වෙළෙඳපොළේ රු.5000/-කට අලෙවි කරන්නේ යැයි සිතමු. ඒ අනුව දේශීය පාවහන් නිෂ්පාදන ආයතනයේ එකතු කළ අගය යම් හෙයකින් රු.2000/-කට වඩා වැඩි වුවහොත් දේශීයව නිපදවන පාවහන් යුගලයේ වටිනාකම රු.5000/- කට වඩා වැඩිවන නිසා ආනයනික පාවහන් යුගලය සමග තරඟ කිරීමට නොහැකි වේ. මේ නිසා දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කිරීමට ආනයනික පාවහන් මත 10% ක ආනයනික තීරු බද්දක් පැනවූයේ යැයි සිතමු එවිට ආනයනික පාවහන් යුගලයක මිළ පහත සඳහන් පරිදි වෙනස් වේ.

තීරු බද්දට පෙර පාවහන් යුගලයේ මිළ = රු. 5000

තීරු බද්ද සඳහා වැය වන මුදල = $5000 \times \frac{10}{100}$

තීරු බද්දෙන් පසු ආනයනික පාවහන් යුගලයේ මිළ = 5000 + 500

**<u>රු.5500</u>**

මෙලෙස ආනයනික පාවහන් යුගලයක් සඳහා තීරු බද්දක් පැනවීම නිසා දේශීය නිෂ්පාදන ආයතනයේ එකතු කළ අගය රු. 2500 දක්වා ඉහළ නැංවීමේ හැකියාවක් තිබේ.

තීරු බද්දෙන් පසු ආනයනික පාවහන් යුගලයේ මිළ = **රු.5500**

තීරු බද්දෙන් පසු දේශීය නිෂ්පාදන ආයතනයේ එකතු කළ අගය = **රු.5500 -3000**

**<u>රු.2500</u>**

ඒ අනුව සඵල ආරක්ෂණ අනුපාතිකය පහත සඳහන් පරිදි ගණනය කළ හැකිය.

$$ERP = \frac{(V_1 - V_0)}{V_0} \text{ X } 100$$

$$ERP = \frac{(2500 - 2000)}{2000} \text{ X } 100$$

= 25%

ඉහත නිදසුනට අනුව නාමික තීරු බද්ද නිසා දේශීය නිෂ්පාදිතයට 25% සඵල ආරක්ෂණයක් සැලසෙන බව පැහැදිලි වේ.

නමුත් ඉහත තීරු බද්ද පනවා ඇත්තේ අවසාන භාණ්ඩයේ වටිනාකම මතය. දේශීය ආයතනය පාවහන් නිෂ්පාදනයට අවශ්‍ය යෙදවුම්ය ආනයනය කිරීමේ දී යම් තීරු බද්දක් අය කර ඇත්නම් එය මෙය තුළ අන්තර්ගත වී නැත. එවිට ඉහත ගණනය කරන ලද සඵල ආරක්ෂණ අනුපාතිකය මගින් දේශීය නිෂ්පාදිතයට ලැබෙන සැබෑ ආරක්ෂණයේ ප්‍රමාණය පිළිබිඹු නොවේ.

ආනයනික යෙදවුම් මත තීරු බද්දක් පනවා ඇති විටෙක සඵල තීරු බදු අනුපාතිකය වෙනස් වන නිසා සඵල ආරක්ෂණ අනුපාතිකය වෙනස් වන ආකාරය පහත සඳහන් නිදසුන ඇසුරෙන් පැහැදිලි කර ගත හැකිය.

නිදසුන **2**

ඉහත දක්වන නිදසුන 1 ට අනුව ආනයනය කරනු ලබන පාවහන් යුගලයක් සඳහා 10% තීරු බද්දක් අය කරනු ලබයි මෙහිදී දේශීය නිෂ්පාදන ආයතනය ආනයනය කරනු ලබන යෙදවුම් සඳහා 5% තීරු බද්දක් අය කරතැයි සිතමු. එවිට ආනයනික යෙදවුම්වල වටිනාකමේ එකතු කළ අගය වෙනස් වේ. ඒ අනුව සඵල ආරක්ෂණ අනුපාතිකය ද වෙනස් වේ.

තීරු බද්දට පෙර ආනයනික යෙදවුම්වල වටිනාකම = රු. 3000

යෙදවුම් සඳහා ගෙවන තීරු බදු ප්‍රමාණය = $3000 \text{ x } \frac{5}{100} = 150$

තීරු බද්දෙන් පසු යෙදවුම්වල වටිනාකම = 3000 + 150

**රු.3150**

තීරු බද්දෙන් පසු දේශීය එකතු කළ අගය = **රු.5500 -3150**

**රු.2350**

සඵල ආරක්ෂණ අනුපාතිකය $= \frac{(2350 - 2000)}{2000} \text{ X } 100$

17.5%

අවසාන භාණ්ඩයට බදු අය කිරීමට අමතරව ආනයනික ආරක්ෂණ යෙදවුම් මතද තීරු බදු පැනවීම නිසා සඵල ආරක්ෂණ අනුපාතය 7.5% කින් (25%-17.5%) පහළ යන බව ඉහත නිදසුනට අනුව පැහැදිලි ය.

අනෙකුත් කරුණු නොවෙනස් ව පවතින අවස්ථාවලදී පහත සඳහන් කොන්දේසි මත සඵල ආරක්ෂණ අනුපාතිකය ඉහළ අගයක් ගනී .

1. අවසාන නිෂ්පාදිතය මත පනවනු ලබන නාමික තීරු බදු අනුපාතිකය ඉහළ අගයක් ගැනීම.
2. ආනයනික යෙදවුම් මත පනවනු ලබන තීරු බදු අනුපාතිකය පහළ අගයක් ගැනීම.
3. භාණ්ඩයේ වටිනාකම තුල ආනයනික යෙදවුම් ප්‍රතිශතය පහළ අගයක් ගැනීම.

**ආනයන සහ අපනයන බඳුවලට අමතරව ආරක්ෂණය සඳහා යොදා ගන්නා ක්‍රියාමාරග කීහිපයක් පහත දැක්වේ .**

- සලාක කිරීම හෙවත් කෝටා නියම කිරීම .
- දේශීය නිෂ්පාදකයන්ට සහනාධාර හෝ දිරිගැන්වීම් හෝ ලබා දීම.
- ප්‍රපාතනය .
- ස්වෙච්ඡාවෙන් අපනයනය සීමා පනවා ගැනීම .
- විදේශ විනිමය පාලනය .
- අපනයන හා ආනයන සීමා පැනවීම .
- වෙළෙඳ සම්බාධක පැනවීම.
- පරිපාලන හා තාක්ෂණික ප්‍රමිතීන් නියම කිරීම.

**ආරක්ෂණවාදයට පක්ෂව පහත සඳහන් තර්ක ඉදිරිපත් කළ හැකිය**

- ජාතික ආරක්ෂාවට අදාළ වන නිෂ්පාදන දේශපාලන හා ආර්ථික තීරණ ගැනීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීම වැදගත් වේ.
- දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමටත් ඒවායේ සේවා නියුක්ත සේවකයන්ගේ රැකියා ආරක්ෂා කිරීම සඳහාත් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති වැදගත් වේ.
- දේශීය ළදරු කර්මාන්ත සඳහා පළපුරුදු විදේශ තරඟකරුවන්ගෙන් ආරක්ෂා කර ගැනීමට ආරක්ෂණවාදී ප්‍රතිපත්ති වැදගත් වේ.
- සීමිත භාණ්ඩ කිහිපයක් මත විශේෂ ප්‍රාගුණ්‍යය කරමින් අන්තර්ජාතික වෙළෙඳාමේ නිරත වන රටවල් මුහුණ පාන උච්චාවචනය වලක්වා ගැනීම (ආර්ථික ස්ථායිතාව ඇති කිරීම) සඳහාත් රටවල ආර්ථිකය විවිධාංගීකරණය කර ගැනීම සඳහාත් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීම වැදගත් වේ.
- ප්‍රපාතනය වලක්වා ගැනීම සඳහා ආරක්ෂණවාදය වැදගත් වේ.
- ගෙවුම් ශේෂ දුෂ්කරතාවලට විසඳුම් සෙවීමේ දී උපකාරී වේ.
- දේශීය සම්පත් උපයෝජනය ඉහළ නැංවීම සඳහා වැදගත් වේ.
- අවගුණ භාණ්ඩ ආනයනය වැළැක්වීමේ දී ආරක්ෂණවාදය වැදගත් වේ.

**ආරක්ෂණවාදයට විපක්ෂව පහත සඳහන් තර්ක ඉදිරිපත් කළ හැකිය**

- ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීම නිසා දේශීය හා විදේශීය වෙළෙඳපොළ සංකෝචනය විය හැකිය.
- විදේශ වෙළෙඳාම සංකෝචනය වීම නිසා ජාතික ආදායම අඩු විය හැකිය.
- දේශීය නිෂ්පාදනවල පිරිවැය අඩු කිරීමට සානුබල නොමැති නිසා අකාර්යක්ෂම කර්මාන්ත බිහි විය හැකිය.
- ගුණාත්මක බවින් ඉහළ භාණ්ඩ නිෂ්පාදනය අඩු විය හැකිය.
- දියුණු තාක්ෂණය සංක්‍රමණයට බාධා ඇති විය හැකිය.

## නිපුණතා මට්ටම 9.3 :

## විදේශ වෙළෙඳ අනුපාතිකයේ ප්‍රභේද දක්වමින් ඒවායේ වෙනස් වීම්වලට හේතු හා ප්‍රතිවිපාක විශ්ලේෂණය කරයි.

- **ඉගෙනුම් පල :**
- වෙළෙඳ අනුපාතිකය අර්ථ දක්වයි.
- වෙළෙඳ අනුපාතිකයේ විවිධ ප්‍රභේද නම් කරයි.
- භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය සමීකරණය මගින් ප්‍රකාශ කරයි.
- දෙන ලද දත්ත මගින් භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය ගණනය කරයි.
- භාණ්ඩ වෙළෙඳ අනුපාතිකයේ වෙනස් වීම්වලට හේතු පැහැදිලි කරයි.
- භාණ්ඩ වෙළෙඳ අනුපාතිකයේ වෙනස් වීම්වල ආර්ථික ප්‍රතිවිපාක විස්තර කරයි.
- ආදායම් වෙළෙඳ අනුපාතිකය සමීකරණ මගින් ප්‍රකාශ කරයි.
- දෙන ලද දත්ත මගින් ආදායම් වෙළෙඳ අනුපාතිකය ගණනය කරයි.
- ආදායම් වෙළෙඳ අනුපාතිකයේ ආර්ථික ප්‍රතිවිපාක විස්තර කරයි.

අපනයනය කරනු ලබන භාණ්ඩ ඒකකයකින් ලබා ගත හැකි ආනයන භාණ්ඩ ඒකක ප්‍රමාණය වෙළෙඳ අනුපාතය ලෙස අර්ථ දැක්විය හැකි ය.

වෙළෙඳ අනුපාතිකයේ ප්‍රභේද දෙකකි

1. භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය

2. ආදායම් වෙළෙඳ අනුපාතිකය

භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය ලෙසින් අර්ථ දක්වන්නේ ද අපනයන ඒකකයකින් ලබා ගත හැකි ආනයන භාණ්ඩ ඒකක ප්‍රමාණය වෙළෙඳ අනුපාතිකය ම ය.

භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය පහත සඳහන් පරිදි සමීකරණයක් ඇසුරෙන් දැක්විය හැකි ය .

$$\text{භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය} = \frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} X100$$

නිදසුන 1

2013 වර්ෂයේ අපනයන මිල දර්ශකය =103.5

2013 වර්ෂයේ ආනයන මිල දර්ශකය =108.4

භාණ්ඩ වෙළෙඳ අනුපාතය $= \frac{103.5}{108.5} \times 100$

=95.47%

භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය වෙනස් වීම කෙරෙහි බලපාන හේතු පහත සඳහන් පරිදි වෙන් කර දැක්විය හැකි ය.

| භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය අඩු වීම කෙරෙහි බලපාන හේතු | භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය වැඩි වීම කෙරෙහි බලපාන හේතු |
|---|---|
| අපනයන මිල දර්ශකය පහත වැටී ආනයන මිල දර්ශකය ඉහළ යාම<br><br>ආනයන මිල දර්ශකයට වඩා වැඩි වේගයකින් අපනයන මිල දර්ශකය පහළ බැසීම<br><br>අපනයන මිල දර්ශකය ස්ථාවරව තිබියදී ආනයන මිල දර්ශකය ඉහළ යාම<br><br>ආනයන මිල දර්ශකය ස්ථාවරව තිබියදී අපනයන මිල දර්ශකය පහත වැටීම | අපනයන මිල දර්ශකය ඉහළ හා ආනයන මිල දර්ශකය පහළ යාම<br><br>අපනයන මිල දර්ශකයට වඩා වැඩි වේගයකින් ආනයන මිල දර්ශකය පහත වැටීම<br><br>අපනයන මිල දර්ශකය ස්ථාවරව තිබියදී ආනයන මිල දර්ශකය පහළ යාම<br><br>ආනයන මිල දර්ශකය ස්ථාවරව තිබියදී අපනයන මිල දර්ශකය ඉහළ යාම |

**භාණ්ඩ වෙළෙඳ අනුපාතිකයේ වෙනස් වීම්වල ආර්ථික ප්‍රතිවිපාක පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.**

**භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය වෙනස් වීම්වල ආර්ථික ප්‍රතිවිපාක**

- ❖ භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය ඉහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක
  - අපනයනවල ආනයන සක්‍යතාව ඉහළ යාම
  - වෙළෙඳ ශේෂය වාසිදායක වීම
  - සමස්ත ශේෂය (ගෙවුම් ශේෂය) වාසිදායක වීම
  - සංචිත හා වත්කම් ඉහළ යාම
- ❖ භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය පහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක
  - අපනයනවල ආනයන සක්‍යතාව පහළ යාම
  - වෙළෙඳ ශේෂ හිඟය වැඩිවීම
  - ගෙවුම් ශේෂයේ සමස්ත හිඟය වැඩිවීම
  - සංචිත හා වත්කම් පහළ යාම

$$\text{ආදායම් වෙළෙඳ අනුපාතිකය} = \frac{\text{අපනයන මිල දර්ශකය X අපනයන පරිමා දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} X100$$

නිදසුන;

2013 වර්ෂයේ අපනයන මිල දර්ශකය =103.5

2013 වර්ෂයේ ආනයන මිල දර්ශකය =108.4

2013 වර්ෂයේ අපනයන පරිමා දර්ශකය =116.4

2013 ආදායම් වෙළෙඳ අනුපාතිකය = $\frac{103.5\times116.4}{108.4}\times 100$

=11,113.8

භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය අපනයන පරිමා දර්ශකයෙන් ගුණ කිරීමෙන් ද ආදායම් වෙළෙඳ අනුපාතිකය ලබා ගත හැකි ය

ආදායම් වෙළෙඳ අනුපාතිකයේ ආර්ථික ප්‍රතිවිපාක පහත සඳහන් පරිදි වෙන් කර දැක්විය හැකි

| ආදායම් වෙළෙඳ අනුපාතිකය ඉහළ යාමේ ආර්ථික ප්‍රතිවිපපාක | ආදායම් වෙළෙඳ අනුපාතිකය පහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක |
|---|---|
| • අපනයන ඉපයුම් වැඩි වීම<br>• අපනයන ශක්‍යතාව ඉහළ යාම<br>• වෙළෙඳ ශේෂය ඉහළ යාම<br>• ගෙවුම් ශේෂය ඉහළ යාම<br>• ගෙවුම් ශේෂයේ සමස්ථ ශේෂය හිතකර තත්ත්වයකට පැමිණීම<br>• උද්ධමනාත්මක බලපෑම් ඇති කිරීම | • ආනයන වියදම් ඉහළ යාම<br>• ආනයන ශක්‍යතාව පහළ යාම<br>• වෙළෙඳ ශේෂය පහළ යාම<br>• ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය අහිතකර තත්ත්වයකට පැමිණීම<br>• උද්ධමනාත්මක බලපෑම් අඩු වීම |

## නිපුණතා මට්ටම 9.4 :

## ගෝලීයකරණය, කලාපීයකරණය හා ද්වි පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් විමසයි.

**ඉගෙනුම් පල :**

- ලෝක වෙළෙඳ සංවිධානයේ අරමුණු පැහැදිලි කරයි.
- ලෝක වෙළෙඳ සංවිධානයේ කාර්යයන් විස්තර කරයි.
- ගෝලීයකරණය අර්ථ දක්වයි.
- ගෝලීයකරණයට පක්ෂ ව හා විපක්ෂ ව ඉදිරිපත් වී ඇති තර්ක ඉදිරිපත් කරයි. ආර්ථික ඒකාබද්ධ වීම් අර්ථ දක්වයි.
- ශ්‍රී ලංකාවේ මෑත කාලීන වෙළෙඳ ගිවිසුම් විස්තර කරයි.
- ද්වි පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්වලට නිදසුන් දක්වයි.
- බහු පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්වලට නිදසුන් දක්වයි.
- විදේශ වෙළෙඳ ගිවිසුම්වල ඇති වැදගත්කම විස්තර කරයි.

ලෝක වෙළෙඳ සංවිධාන යනු බහු පාර්ශවික වෙළෙඳාමේ ප්‍රවර්ධනයටත් වෙළෙඳාම සුමටව සහ ක්‍රමවත්ව පවත්වා ගෙන යාමටත් වෙළෙඳාම හා තීරු බදු පිළිබඳ පොදු සම්මුතිය වඩාත් ශක්තිමත් කරමින් 1995 දී පිහිටුවා ගනු ලැබූ ජාත්‍යන්තර සංවිධානයකි

❖ ලෝක වෙළෙඳ සංවිධානයේ ප්‍රධාන අරමුණු

- බහු පාර්ශවීය වෙළෙඳ ප්‍රවර්ධනය කිරීම.
- වෙළෙඳාම ක්‍රමවත්ව පවත්වාගෙන යාම.
- වෙළෙඳ බාධක අවම කිරීම සහ වෙළෙඳ නීති සංශෝධනය කිරීම මගින් ජාත්‍යන්තර වෙළෙඳ ක්‍රමය තුළ ප්‍රධාන ප්‍රතිසංස්කරණයක් ඇති කිරීම.

❖ ලෝක වෙළෙඳ සංවිධානයේ ප්‍රධාන කාර්ය 6 කි

- ලෝක වෙළෙඳ සංවිධානය යටතේ සාමාජික රටවල් අත්සන් කොට ඇති ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් නිසි ලෙස ක්‍රියාත්මක වේ ද යන්න පරිපාලනය කිරීම.
- නිදහස් වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීමට අදාළ සාකච්ඡා සඳහා වේදිකාවක් සැපයීම.
- වෙළෙඳපොළ ආරවුල් බේරුම් කිරීම.
- සාමාජික රටවල් ජාතික ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම.
- තාක්ෂණික ආධාර හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් සංවර්ධනය වන රටවලට වෙලඳ ප්‍රතිපත්තිය පිළිබඳ ගැටලු විසඳා ගැනීමට ආධාර කිරීම.
- වෙනත් ජාත්‍යන්තර ආර්ථික සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

ගෝලීයකරණය යනු ලෝකයේ රටවල් ආර්ථිකමය සංස්කෘතිමය හා දේශපාලනමය වශයෙන් විවිධ ප්‍රමාණයෙන් ඔස්සේ එකිනෙකට ඒකාබද්ධ වීමේ ප්‍රවණතාවයයි

ආර්ථික විද්‍යාවේදී අවධානය යොමු කරනු ලබන්නේ ආර්ථික ගෝලීයකරණය කෙරෙහිය

ආර්ථික ගෝලීයකරණය යනු ලෝකයේ රටවල් වෙළෙඳ ප්‍රාග්ධන මූල්‍ය තාක්ෂණ ප්‍රතිපත්ති යනාදී විවිධ ප්‍රවාහයන් ඔස්සේ එකිනෙකට ඒකාබද්ධ වීමේ ක්‍රියාවලියයි

වර්තමානයේ ආර්ථික ගෝලීයකරණය තාක්ෂණය හා ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වේ

ගෝලීයකරණය නිසා ලෝක ආර්ථිකයේ අන්‍යෝන්‍ය රැඳියාව මූල්‍ය ප්‍රවාහයන්ගේ වර්ධනය නිෂ්පාදන ක්‍රියාවලිය ජාත්‍යන්තරකරණය හා ජාත්‍යන්තර ශ්‍රම සංචලනය තීව්‍ර වේ

❖ **ගෝලීයකරණයට පක්ෂව පහත සඳහන් තර්ක ඉදිරිපත් කළ හැකිය**

- නිෂ්පාදන ක්‍රියාවලිය විකේන්ද්‍රණය වීම නිසා නිෂ්පාදන හා පරිභෝජන පර්යන්තයෙන් එපිටට විතැන් වීම.
- නව අදහස් හා අත්දැකීම් ලැබීම .
- ලෝකයේ වෙළෙඳ පරිමාව ඉහළ යාම
- ආර්ථික වෘද්ධි උපාය මාර්ගයක් ලෙස භාවිත කිරීමට හැකිවීම.
- විදේශ ආයෝජන ඉහළ යාම.
- අමුද්‍රව්‍ය අඩුමිලට ආනයනය කළ හැකිවීම.
- විදේශ සේවා නියුක්තිය ඉහළ යාම.
- අධ්‍යාපනය හා දැනුම දියුණු වීම.
- නව රැකියා අවස්ථා බිහි වීම.
- නව තාක්ෂණය ප්‍රසාරණය වීම.
- තරගකාරිත්වය නිසා ගුණාත්මක නිෂ්පාදනය බිහි වීම.
- අන්තර්ජාලය ඔස්සේ තොරතුරු ලබාගත හැකි වීම.

**ගෝලීයකරණයට විපක්ෂව පහත සඳහන් තර්ක ඉදිරිපත් කළ හැකිය**

- සංවර්ධිත රටවලට වැඩි ප්‍රතිලාභ හිමිවීම
- ජාත්‍යන්තරවශයෙන්ආදායම්විෂමතාපුළුල්වීම
- ගෝලීය ආර්ථික අර්බුද අනෙකුත් රටවලටපහසුවෙන්ව්‍යාප්ත වීම
- සමාජ ගැටුම් වර්ධනය වීම
- මිනිස්ජීවිත කෙරෙහිඅනාරක්ෂිත බවක්ඇතිකිරීම
- පාරිසරික ගැටලුඇතිවීම
- සංස්කෘතියවිනාශවීම
- මූල්‍යවෙළෙඳපොළඅස්ථායිතාවන්ඇතිවීමනිසා ආර්ථික අර්බුද හට ගැනීම
- දේශීය කර්මාන්ත බිඳ වැටීමහා රැකියාඅහිමිවීම
- ත්‍රස්තවාදයව්‍යාප්ත වීම
- සෞඛ්‍ය ගැටලුඇතිවීම

විවිධ රටවල් අතර තීරුබදු හා තීරුබදු නොවන බාධකවලින් තොරව භාණ්ඩ , සේවා සහ නිෂ්පාදන බාධක හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය ආර්ථික ඒකාබද්ධ වීම ලෙස හඳුන්වයි

**ආර්ථික ඒකාබද්ධවීම් වල විවිධ ස්වරූප පහත දැක්වේ**

1 වර්ණීය වෙළෙඳ කලාප (Preferential Trade Agreement-PTA)

2 නිදහස් වෙළෙඳ කලාප (Free Trade Area-FTA)

3 තීරුබදුසංගම් (Custom Union-CU)

4 පොදු වෙළෙඳපොළ (Common Market-CM)

5 .ආර්ථිකහාමූල්‍යසංගම් (Economic and Monetary Unions-EU)

6. පූර්ණ ආර්ථික ඒකාබද්ධවීම් (Fully Economic Intergration-FEI)

සාමාජික නොවන රටවල් අතර වෙළෙඳාමේදී භාවිත කරන වෙළෙඳ සංරෝධකවලට වඩා අඩු සංරෝධක යටතේ සාමාජික රටවල් අතර භාණ්ඩ හා සේවා හුවමාරුකර ගැනීම සඳහා රටවල් එකතු වී පිහිටුවාගෙන ඇති සංවිධාන වර්ණීය වෙළෙඳ කලාප ලෙස හැඳින්වේ

මේ යටතේ ගිවිසුම්ගත රටවල විසින් කලාපයේ අභ්‍යන්තර වෙළෙඳාම සඳහා එකගතාවට බැඳුණු පොදු තීරුබදු වලින් කිසියම් ප්‍රතිශතයක් කපා හරිනු ලබයි

**නිදසුන්** :-

- යුරෝපා ආර්ථික කලාපීය ගිවිසුම(European Economic Area Agreement-EEAA)
- උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම(North American Free trade Agreement-NAFTA)

සාමාජික රටවල් සාමාජික නොවන රටවල් සමග වෙළෙඳාමේ යෙදෙන විට එම රටවල අභිමතය පරිදි වෙළෙඳ සංරෝධක පවත්වාගෙන යාමටත් සාමාජික රටවල් අතර වෙළෙඳාම සංරෝධකවලින් තොරව පවත්වාගෙන යාමටත් රටවල් කීපයක'එකතු වී ඇති කරගන්නා සංවිධාන නිදහස් වෙළෙඳ කලාපවේ'

මෙහිදී ගිවිසුම්ගත රටවල විසින් එකග වූ තීරුබදු කාණ්ඩවලට අයත් තීරුබදු මුළුමනින්ම ඉවත් කෙරේ'

❖ **නිදහස් වෙළෙඳ කලාප සඳහා නිදසුන් පහත දැක්වේ'**

- අප්‍රිකානු නිදහස්වෙළෙඳ කලාපය (African Free Trade Zone-AFTZ)
- ආසියානු පැසිපික් නිදහස් වෙළෙඳ කලාපය (Asian Pasific Free Trade Zone-APTZ)
- මධ්‍යම යුරෝපා නිදහස් වෙළෙඳ කලාපය (Central European Freo Trade Zone-CEFTA)
- උතුරු ඇමෙරිකානු නිදහස වෙළෙඳ කලාපය (North American Free Trade Zone-NAFTZ)

.සාමාජික රටවල් අතර වෙළෙඳාම වෙළෙඳ සංරෝධක වලින් තොරව පවත්වාගෙන යාම සඳහාත් සාමාජික සහ සාමාජික නොවන රටවල් අතර එක සමාන වෙළෙඳ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාම සඳහාත් රටවල් කීපයක් එකතු වී ඇතිකර ගන්නා සංගම් තීරුබදු සංගම් නමින් හැඳින්වේ'

මෙහිදී ගිවිසුම්ගත භාණ්ඩ කාණ්ඩවලට අදාළ වෙනත් රටවලින් ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා සමාන තීරුබදු ප්‍රමාණයක් ක්‍රියාත්මක වන අතර ගිවිසුම්ගත භාණ්ඩ කාණ්ඩ සඳහා සංගමයේ සාමාජිකත්වය දරන රටවල තීරුබදු මුළුමනින් ම ඉවත් කෙරේ'

❖ **තීරුබදු සංගම් සඳහා නිදසුන් කීපයක් පහත දැක්වේ'**

- මධ්‍යම අමෙරිකානු පොදු වෙළෙඳපොළ (Central American Common Market-CACM)
- කැරිබියානු ප්‍රජාව (Caribbean Community-CARICOM)
- දකුණු අප්‍රිකානු තීරුබදු සංගමය (North American Community-NAC)

සාමාජික රටවල් අතර භාණ්ඩ හා සේවා වෙළෙඳාම සංරෝධක වලින් තොරව පවත්වාගෙන යාමටත් සාමාජික රටවල් සාමාජික නොවන රටවල් සමග වෙළෙඳාම පවත්වාගෙනයාමේද පොදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමටත් සාමාජික රටවල් අතර නිෂ්පාදන සාදක නිදහසේ සංචලනය කිරීමටත් රටවල් ඒකාබද්ධවීම පොදුවෙළෙඳපොළ නමින් හැඳින්වේ'මේ යටතේ ශ්‍රමය හා ප්‍රාග්ධනය වැනි නිෂ්පාදන සාදක හා භාණ්ඩ හා සේවා ගිවිසුම්ගත රටවල් අතර බාධකයකින් තොර ව සංචලනය කිරීමේ හැකියාව ලැබේ'

**පොදු වෙළෙඳපොළ සඳහා නිදසුන් කීපයක් පහත දැක්වේ'**

- කැරිබියන් කොමියුනිටි පොදු වෙළෙඳපොළ
  (The Caribbean Community and Common Market)
- මධ්‍යම ඇමෙරිකානු පොදු වෙළෙඳපොළ(Central American Common Market)
- මධ්‍යම අප්‍රිකානු ආර්ථික හා මූල්‍ය සංගමය
  (Central African Economic and Monetary Community)

සාමාජික රටවල් අතර වෙළෙඳාම සංරෝධක වලින් තොර ව පවත්වාගෙන යාමටත් සාමාජික හා සාමාජික නොවන රටවල් අතර භාණ්ඩ හා සේවා වෙළෙඳාම පොදු ප්‍රතිපත්තියක් යටතේ පවත්වාගෙන යාමටත් සාමාජික රටවල් අතර ශ්‍රමය හා ප්‍රාග්ධනය නිදහසේ සංචලනය කිරීමටත් සාමාජික රටවල් අතර එකහා සමාන මූල්‍ය ප්‍රතිපත්තියක් භාර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමටත් රටවල් කීපයක් එකතු වී පිහිටුවා ගන්නා සංගම් ආර්ථික හා මූල්‍ය සංගම් යනුවෙන් හැඳින්වේ'

**ආර්ථික හා මූල්‍ය සංගම් සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ'**

- මධ්‍යම අප්‍රිකානු ආර්ථික හාමූල්‍ය සංගමය

  (Central African Economic and Monetary Community-CEMAC)

- බටහිර අප්‍රිකානු ආර්ථික හා මූල්‍ය සංගමය

(Economic Community West African-ECOWAS)

- යුරෝපා මූල්‍ය හා ආර්ථික සංගමය

(European Economic and Monetary Union-EMU)

සාමාජික හා සාමාජික නොවන රටවල් අතර භාණ්ඩ හා සේවා සහ නිෂ්පාදන සාධක හුවමාරු කිරීමේදී සංරෝධක වලින් තොරව කටයුතු කිරීම සඳහාත් සාමාජික රටවල් අතර ඒකීය මූල්‍ය ප්‍රතිපත්තියක් රාජ්‍ය මූල ප්‍රතිපත්ති ව්‍යවස්ථාධායකය විධායකය අධිකරණ හා දේශපාලන ප්‍රතිපත්ති පවත්වාගෙන යාම සඳහා ලෝකයේ රටවල් එකතු වීම පූර්ණ ඒකාබද්ධවීම ලෙස හඳුන්වයි'

ආර්ථික ඒකාබද්ධවීම් සඳහා අත්සන් කරනු ලබන ගිවිසුම් වර්ග දෙකකට බෙදිය හැකිය'

1 'ද්වි පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්

2 'බහු පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්

වෙළෙඳාම හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් රටවල් දෙකක් අතර ඇතිකර ගන්නා වෙළෙඳ ගිවිසුම් ද්වි පාර්ශවීය වෙළෙඳ ගිවිසුම් ලෙෂ හැඳින්වේ'

වර්තමානයේ ශ්‍රී ලංකාව ඇතුළත් වී සිටින ද්වීපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් පහත දැක්වේ'

- ඉන්දු ලංකානිදහස්වෙළෙඳ ගිවිසුම: (ISFTA)
- පාකිස්තානු ශ්‍රී ලංකානිදහස්වෙළෙඳ ගිවිසුම්වේ' (PSFTA)

වෙළෙඳාම හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් රටවල් කිහිපයක් අතර ඇතිකර ගන්නා වෙළෙඳ ගිවිසුම් බහුපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්වේ'

ශ්‍රී ලංකාව ඇතුළත් වී සිටීන'බහු පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් කිහිපයක් පහත දැකවේ'

දකුණු ආසියානු නිදහස්වෙළෙඳ ගිවිසුම (SAFTA)

**විදේශ වෙළෙඳ ගිවිසුම්වල ඇති වැදගත්කම පහත දැක්වේ'**

- රටවල් අතර සහයෝගීතාව වර්ධනය වීම'
- වෙළෙඳපොළ පුළුල් වීම'
- ප්‍රවාහණ පිරිවැය අඩුවීම'
- දේශීය වෙළෙඳපොළ භාණ්ඩ මිල ගණන් පහළයාම'
- විදේශ ආයෝජන වර්ධනය වීම'
- නව කාර්මික භාණ්ඩ අඩුමිලකට ලබා ගත හැකිවීම'
- සේවානියුක්තිය ඉහළ යාම'
- අමුද්‍රව්‍ය මිල පහළ යාම'
- අපනයන විවිධාංගීකරණයට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් වීම'

## නිපුණතා මට්ටම 9.5 :

## ශ්‍රී ලංකා විදේශ වෙළෙඳාමේ ස්වභාවය හා විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති විමර්ශනය කරයි.

**ඉගෙනුම් පල :**

- ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳාම විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ අපනයනය ව්‍යුහය විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ ආනයන වෙළෙඳාම විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ ආනයන ව්‍යුහය මහ බැංකු වාර්තා දත්ත අනුව විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ ආනයන උපනති මහ බැංකු වාර්තා දත්ත අනුව පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති (කාලීන තොරතුරු ඇසුරෙන්) විස්තර කරයි.
- අපනයන වෙළෙඳාමේ දී මුහුණ පාන ගැටලු විස්තර කරයි.
- අපනයන වෙළෙඳාම මුහුණ දෙන ගැටලු සහ ඒවාට විසඳුම් ඉදිරිපත් කරයි

කිසියම් රටක් ලෝකයේ වෙනත් රටවලට භාණ්ඩ හා සේවා අලෙවි කිරීම අපනයන වෙළඳාමයි

නිදසුන් : ශ්‍රී ලංකාව ඇමරිකා එක්සත් ජනපදයට තේ අලෙවි කිරීම

- ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය පහත පරිදි ඉදිරිපත් කළ හැකිය
- කෘෂිකාර්මික අපනයන
- කාර්මික අපනයන
- ඛනිජ ද්‍රව්‍ය අපනයනය
- වර්ග නොකළ අපනයන

ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය පහත පරිදි ප්‍රතිශතාත්මකව දැක්විය හැකි වේ

| | 2015 | 2016 |
|---|---|---|
| • කෘෂිකාර්මික අපනයන | 23.5% | 22.6% |
| • කාර්මි අපනයනය | 76% | 77% |
| • ඛනිජ තෙල් ද්‍රව්‍ය අපනයන | 0.3% | 0.3% |
| • වර්ග නොකළ අපනයන | 0.2% | 0.1% |

අපනයනය කරනු ලබන කෘෂිකාර්මික භාණ්ඩවලට නිදසුන් පහත පරිදි දැක්විය හැකිය

(තේ, රබර්, පොල්, අනෙකුත් කෘෂිකාර්මික අපනයන)

- අපනයනය කරනු ලබන කාර්මික භාණ්ඩවලට නිදසුන් පහත පරිදි දැක්විය හැකිය

(ආහාරපාන හා දුම්කොළ , රෙදිපිළි හා ඇගලුම් , ඛනිජ නිෂ්පාදිත , පිගන් නිෂ්පාදිත ,සම්, ගමන් මලු, පාවහන් , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ , දියමන්ති හා ස්වර්ණාභරණ , අනෙකුත් කාර්මික අපනයන)

- අපනයනය කරනු ලබන ඛනිජ ද්‍රව්‍යවලට නිදසුන් පහත දැක්වේ

  ( මැණික් , අනෙකුත් ආයෝජන භාණ්ඩ අපනයනය)

- 1977 න් පසු අපනයන ව්‍යුහයේ වෙනස්වීම වර්තමානය දක්වා පහත ආකාරයට පෙන්වා දිය හැකිය

| අපනයන ව්‍යුහය | 1977 | 2016 |
|---|---|---|
| කෘෂිකාර්මික භාණ්ඩ | 79% | 22% |
| කාර්මික භාණ්ඩ | 14% | 77% |
| වෙනත් | 07% | 01% |

කාර්මික භාණ්ඩ අපනයනය වෙනස් වීම 1977 සිට 2015 දක්වා
විස්තරාත්මකව පහත වගුවෙන් දැක්වේ

| කාර්මික භාණ්ඩ | 1977 | 2015 | 2016 |
|---|---|---|---|
| රෙදිපිලි හා ඇගලුම් | 02% | 46% | 47% |
| ඛනිජ තෙල් නිෂ්පාදනය | 09% | 04% | 05% |
| ආහාරපාන හා දුම්කොළ | - | 03% | 03% |
| දියමන්ති හා ස්වර්ණාභරණ | - | 03% | 03% |
| රබර් නිෂ්පාදන | - | 07% | 7% |
| අනෙකුත් කාර්මික උපකරණ | 03% | 06% | 08% |
| ප්‍රවාහන උපකරණ | - | 23% | 01% |
| සම්භාණ්ඩ ප්‍රවාහන හා පාවහන් උපකරණ | - | 13% | 2% |

ශ්‍රී ලංකාවේ ආනයන ව්‍යුහය පහත පරිදි දැක්විය හැකිය

- ශ්‍රී ලංකාව ජපානයෙන් වාහන මිලදී ගැනීම
- පරිභෝජන භාණ්ඩ
- අන්තර භාණ්ඩ
- ආයෝජන භාණ්ඩ
- වර්ග නොකළ භාණ්ඩ

[2016 මහ බැංකු වාර්තාවට අනුව]

- ආනයනය කරන පාරිභෝගික භාණ්ඩවලට නිදසුන් පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය

  ( සහල් සීනි තිරිඟු පිටි කිරි පිටි , පෞද්ගලික මෝටර් රථ , විදුලි උපකරණ)

- ආනයනය කරන අන්තර භාණ්ඩවලට නිදසුන් පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය
  (ඛනිජ තෙල් , පොහොර , රසායනික ද්‍රව්‍ය , රෙදිපිළි හා ඇඟලුම් )
- ආනයනය කරන ආයෝජන භාණ්ඩවලට නිදසුන් පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය

  (යන්ත්‍ර සූත්‍ර හා උපකරණ , ප්‍රවාහණ උපකරණ , ගොඩනැගිලි ද්‍රව්‍ය)

1977 සිට 2015 දක්වා ආනයන ව්‍යුහය

කාලීන වශයෙන් වෙනස් වී ඇති ආකාරය

පහත පරිදි දැක්විය හැකිය

| ආනයන ව්‍යුහය | 1977 | 2015 | 2016 |
|---|---|---|---|
| පාරිභෝගිකභාණ්ඩ | 42% | 25% | 22% |
| අන්තර භාණ්ඩ | 48% | 51% | 51% |
| ආයෝජන භාණ්ඩ | 12% | 24% | 27% |
| වෙනත් | 01% | - | - |

'

අන්තර් භාණ්ඩවල වෙනස් වීම් 1977 සිට 2016 දක්වා

සවිස්තරාත්මක ව පහත දැක්වේ

| අන්තර් භාණ්ඩ | 1977 | 2015 | 2016 |
|---|---|---|---|
| බොර තෙල් | 23% | 143% | 128% |
| රෙදි පිළි | 03% | 12% | 14% |
| දියමන්ති | - | 09% | 3% |
| රසායනික ද්‍රව්‍ය | 01% | 46% | 44% |
| තිරිඟු සහ ඉරිඟු | 01% | 19% | 13% |
| පොහොර | - | 15% | 07% |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | - | 157% | 151% |

## ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්තිය ගැන සලකා බැලීමේදී පහත සඳහන් කරුණු 2016 මහ බැංකු වාර්තාව අනුව දැක්විය හැකිය

- ගෝලීය ආර්ථිකය හා ශ්‍රී ලංකාව අතර ඇති සබැඳියාව වැඩි දියුණු කිරීම කෙරෙහි යොමු වූ විදේශ වෙළෙඳ ප්‍රතිපත්තියක් 2015 හා 2016 වසරේදී අඛණ්ඩව ක්‍රියාත්මක විය
- විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති රාමුවක් ඇති කිරීම සඳහා රජය පුළුල් ව්‍යුහාත්මක වෙනස්කම් රාශියක් යෝජනා කරන ලදී
- වෙළෙඳාම තීරණය වන නීති රෙගුලාසි වෙනස් කිරීමට ප්‍රයත්න දැරීම
- වෙළෙඳ ගිවිසුම් ඇති කිරීම මගින් විදේශ වෙළෙඳපොළ වෙත ශක්තිමත් ප්‍රවේශයක් ඇති කිරීම
- උපාය මාර්ගික වෙළෙඳ ප්‍රවර්ධනය
- වෙළෙඳ තීරු බදු ප්‍රතිපත්තිය තව දුරටත් තාර්කීකරණය
- නොබැඳි විදේශ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී අපනයනය ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛත්වය ලබා දීම
- ආනයන තාර්කීකරණය සඳහා ද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීම
- ආයෝජන ප්‍රවර්ධන සඳහා උපකාරී වන ද්විපාර්ශික ගිවිසුම්වලට එළඹීම
- ශ්‍රී ලංකාව ලෝක වෙළෙඳ සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලබන බහුපාර්ශවීය ක්‍රියාමාර්ග සඳහා අඛණ්ඩව සම්බන්ධ වීම

### අපනයන වෙළෙඳාමේ දී මුහුණ දෙන ගැටලු කිහිපයක් පහත දැක්වේ

- අපනයන බෝගවල මිල උච්චාවචනය වීම
- අපනයන පරිමාව අඩු වීම
- ලෝක වෙළෙඳපොළේ ඇති දැඩි අවිනිශ්චිතතාවය
- ගෝලීය ආර්ථික අවපාතය
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල් වර්ධනය මන්දගාමී වීම

## ඉහත ගැටලුවලට ඉදිරිපත් කළ හැකි විසඳුම් කිහිපයක් පහත දැක්වේ

- ගෝලීය ආර්ථිකය හා ශ්‍රී ලංකාව අතර ඇති සම්බන්ධතාව වැඩි දියුණු කිරීම කෙරෙහි යොමු වීම
- විදේශ වෙළෙඳපොළවල සිදු කරන අලෙවිකරණ හා ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන් ඉහළ නැංවීම
- වෙළෙඳ ගිවිසුම් ඵලදායී ලෙස ශක්තිමත් කිරීම හා නව අපනයන වෙළෙඳපොළවල් ආරක්ෂා කර ගැනීමට හා දැනට පවතින වෙළෙඳපොළවල් පුළුල් කිරීම හා භාණ්ඩ විවිධාංගීකරණය කිරීම
- අපනයන කෙරෙහි යොමු වූ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අත්‍යවශ්‍ය ආයතන ස්ථාපිත කිරීම
- අපනයන සංවර්ධන සඳහා කවුන්සලයක් පිහිටුවීම

## ආදර්ශ ප්‍රශ්න

1 .1 අන්තර් ජාතික වෙළඳාමේදී 'ආරක්ෂණවාදී ප්‍රතිපත්ති' යන්න හඳුන්වන්න. (ල. 04)

2 ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අහිතකර ප්‍රතිඵල කවරේද? (ල. 04)

3 විදේශ වෙළඳාමේ කටයුතු වල යෙදීසිටින " සහ ඊ රටවල් දෙකට අදාළ යෙදවුම් ඒකකයක නිමවුම පහත දැක්වේ.(Kg)

| | A | B |
|---|---|---|
| සීනි | 70 | 30 |
| පිටි | 90 | 60 |

(අ) සීනි සහ පිටි නිෂ්පාදනය සම්බන්ධව නිරපේක්ෂ වාසි ඇත්තේ කුමන රටවලටද? (ල. 02)

(ආ) විදේශ වෙළඳාමේ ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා විදේශ වෙළඳාමේ යෙදීමට මෙම භාණ්ඩ දෙක සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි ඇති රට කුමක්ද? (ල. 04)

(ඇ) භාණ්ඩ දෙක සම්බන්ධව අභ්‍යන්තර හුවමාරු වාසිය අගයන්න. (ල. 02)

(ඈ) මෙම භාණ්ඩ දෙක සම්බන්ධව ජාත්‍යන්තර හුවමාරු අනුපාතය ගණන කරන්න. (ල. 02)

2). විදේශ වෙළඳාමේ නිරපේක්ෂ වාසිය සහ සාපේක්ෂ වාසිය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

1 තීරු බදු නොවන ආරක්ෂණ වාදී ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 2)

3 පහත දැක්වෙන්නේ සමාන සම්පත් ප්‍රමාණයක් යොදාගනිමින් ප්‍රංශය හා එංගලන්තයට නිපදවිය හැකි තිරිඟු හ

තරදි ඒකක ප්‍රමාණයය

| රට | තිරිඟු | රෙදි |
|---|---|---|
| ප්‍රංශය | 200 | 100 |
| එංගලන්තය | 100 | 80 |

අ) ප්‍රංශයේ සහ එංගලන්තයේ තිරිඟු සහ රෙදි නිපදවීමේ ආවස්ථික පිරිවැය ගණනය කරන්න. (ල. 4)

ආ) රටවල් 2 අතර වාසිදායක වෙළඳාමක් බිහිවීම සඳහා තිරිඟු සහ රෙදි හුවමාරු විය යුතු අභ්‍යන්තර හා බාහිර හුවමාරු අනුපාත කවර ආකාර වේද?